**උතුරු මැද පළාත් සභාව - 2014**

**---------------------------------**

උතුරු මැද පළාත් සභාවේ 2014 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2014 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1987 අංක 42 දරන පළාත් සභා පනතේ 23(1) වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පළාත් සභා පනතේ 23(2) වගන්තිය ප්‍රකාර මෙම වාර්තාව නිකුත් කරනු ලැබේ. මෙහි ඇතුළත් විගණන නිරීක්ෂණ පිළිබඳ විස්තරාත්මක වාර්තාව පළාත් සභාවේ සභාගත කිරීම සඳහා යථා කාලයේදී නිකුත් කරනු ලැබේ.

1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම.

---------------------------------------------------------------------

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමණාකරණයේ වගකීම වේ.

1.3 විගණකගේ වගකීම

-------------------------

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් උත්තරීතර විගණන ආයතනයන්ගේ ජාත්‍යන්තර විගණන ප්‍රමිතිවලට (ISSAI 1000-1810) අනුරූප ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදුකරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවන්ට මම අනුකූල වන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබා ගැනීම පිණිස විගණනය සැළසුම් කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට උපකාරීවන විගණන සාක්ෂි ලබා ගැනීම පිණිස පරිපාටී ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්, වංචා

හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් අවදානම් තක්සේරු කිරීම විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම්වලදී අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටී සැලසුම් කිරීම පිණිස පළාත් සභාවේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාල වන්නාවූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් පළාත් සභාවේ අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගැයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගැයීමද විගණනයට ඇතුළත් වේ.

මාගේ තත්ත්වාගණනය කල විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.4 තත්ත්වාගණනය කල මතය සඳහා පදනම

---

මෙම වාර්තාවේ 2.2 ඡේදයෙහි දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

2. මූල්‍ය ප්‍රකාශන

---

2.1 තත්ත්වාගණනය කල මතය

---

මෙම වාර්තාවේ 2.2 ඡේදයෙහි දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශන වලින් 2014 දෙසැම්බර් 31 දිනට උතුරු මැද පළාත් සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කරන බව මා දරන්නා වූ මතය වේ.

## 2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳව අදහස් දැක්වීම

### 2.2.1 පළාත් සභා අරමුදල

පළාත් සභා අරමුදලට අදාල සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2015 මැයි 14 දින විගණනයට ඉදිරිපත් කරන ලදී.

### 2.2.2 අනෙකුත් ගිණුම්

සමාලෝචිත වර්ෂයට අදාලව 2015 අප්‍රේල් 30 දිනට පළාත් සභාවේ අනෙකුත් ගිණුම් ඉදිරිපත් කිරිමේ ප්‍රගතිය පහත දැක්වේ.

| | | 2014 වර්ෂයට අදාලව | | | ඉකුත් වර්ෂවලට අදාලව |
|---|---|---|---|---|---|
| | | මුළු ගිණුම් සංඛ්‍යාව | ඉදිරිපත් කල ගිණුම් සංඛ්‍යාව | ඉදිරිපත් නොකල ගිණුම් සංඛ්‍යාව | ඉදිරිපත් නොකල ගිණුම් සංඛ්‍යාව |
| (i) | විසර්ජන ගිණුම් | 30 | 30 | - | - |
| (ii) | ආදායම් ගිණුම් | 23 | 23 | - | - |
| (iii) | පළාත් සභා නිලධාරින්ට අත්තිකාරම් ගිණුම් | 33 | 33 | - | - |
| (iv) | වාණිජ අත්තිකාරම් ගිණුම් | 07 | 07 | - | - |
| (v) | අරමුදල් ගිණුම් | 05 | 02 | 03 | 23 |
| (vi) | ප්‍රඥප්ති ගිණුම් | 07 | 04 | 03 | 01 |
| (vii) | ස්වයං රැකියා වක්‍රීය ණය අත්තිකාරම් ගිණුම | - | - | - | 02 |
| | | 105 | 99 | 06 | 26 |

2.2.3 ගිණුම්කරණ ප්‍රතිපත්ති.

-------------------------

පළාත් සභා අරමුදලේ ආදායම් හා වියදම් උපචිත පදනම මත මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි.

2.2.4 ගණකාධිකරණ අඩුපාඩු.

----------------------------

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) උතුරු මැද පළාත් සභාවේ ස්ථාවර වත්කම් ලේඛනයේ දක්වා තිබුණු පහත වත්කම්වල වටිනාකම තක්සේරු කර නොතිබීම හේතුවෙන් ඒවායේ වටිනාකම් මූල්‍ය ප්‍රකාශන හා කාර්යය සාධන වාර්තාවෙන් අත්හැරී තිබුණි.

| වත්කම | ප්‍රමාණය |
| --- | --- |
| ඉඩම් | අක්කර 540 රූඩ් 1 පර්චස් 10 |
| වාහන | 33 |
| ගොඩනැගිලි | වර්ග මීටර් 38168 ක ගොඩනැගිලි 124 |
| ගෘහ භාණ්ඩ හා කාර්යාල උපකරණ | විශාල ප්‍රමාණයක් |
| යන්ත්‍ර හා යන්ත්‍රෝපකරණ | -එම- |

(ආ) මූල්‍ය ප්‍රකාශන හා කාර්ය සාධන වාර්තාව සමඟ වූ සටහන 22 ප්‍රකාරව දිගු කාලීන මූල්‍ය කල්බදු වගකීම රු.12,888,653 ක් වුවද සත්‍ය දිගු කාලීන කල්බදු වගකීම රු.10,390,606 ක් විය.

(ඇ) මුදල් ප්‍රවාහ ප්‍රකාශනයේ ආයෝජන ක්‍රියාකාරකම්වලින් වූ ප්‍රවාහයන් යටතේ දැක්විය යුතු රු.57,899,982 ක් වූ ආයෝජන පොලී ලැබීම් මූල්‍ය ක්‍රියාකාරකම්වලින් වූ ප්‍රවාහයන් යටතේ දක්වා තිබුණි.

2.2.5 නොසැසඳුණු පාලන ගිණුම්.

-------------------------------

පහත නිරීක්ෂණයන් විය.

(අ) මූල්‍ය ප්‍රකාශන හා කාර්ය සාධන වාර්තාවේ උපලේඛන අංක 03 ට අනුව ආයතන 05 කට අදාල ඉදිරියට කල ගෙවීම් රු.1,726,487 ක් වූ නමුත් එකී ආයතනවල විසර්ජන ගිණුම්හි

සටහන (iii) හි වූ ඉදිරි වර්ෂය වෙනුවෙන් කරන ලද ගෙවීම් පිළිබඳ වාර්තාව අනුව එය රු.802,439 ක් විය.

(ආ) මූල්‍ය ප්‍රකාශන හා කාර්ය සාධන වාර්තාව සමඟ වූ උපලේඛන 01 හි හා 02 හි ඇතුලත් බැරකම් හා අමාත්‍යාංශ සහ දෙපාර්තමේන්තුවල විසර්ජන ගිණුම්හී ඩී.ජී.එස්.ඒ. – 8 ආකෘතියේ දක්වා ඇති බැරකම් අතර රු.8,202,595 ක් නොසැසඳුණු වෙනසක් විය.

(ඇ) පළාත් භාණ්ඩාගාරය හා පළාත් ආදායම් දෙපාර්තමේන්තුව විසින් විගණකාධිපති වෙත ඉදිරිපත් කර තිබුණු ආදායම් ගිණුම් 03 ක රු.126,744,276 ක් වූ ආදායම, මූල්‍ය ප්‍රකාශන හා කාර්ය සාධන වාර්තාව සමඟ වූ අංක 01 හා 02 සටහන් අනුව රු.127,715,642 ක් වීමෙන් රු.971,366 ක නොසැසඳුණු වෙනසක් විය.

2.2.6 විගණනය සඳහා සාක්ෂි නොමැතිවීම.

----------------------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් විය.

(අ) පිළිතුරු නොලත් විගණන විමසුම්

----------------------------------------

පළාත් කෘෂිකර්ම දෙපාර්තමේන්තුව විසින් ක්‍රියාත්මක කර තිබුණු රු.14,459,914 ක පිරිවැය වූ ඉදිකිරීම් ව්‍යාපෘතියක් සම්බන්ධයෙන් නිකුත් කර ඇති විගණන විමසුමක්ද ඇතුළුව 2013 වර්ෂයේදී නිකුත් කරන ලද විගණන විමසුම් 04 ට පිළිතුරු සපයා නොතිබුණි.

(ආ) පොත් පත් හා ලේඛන නොපැවැත්වීම

----------------------------------------------

පළාත් ප්‍රධාන අමාත්‍යාංශය විසින් ඉන්වෙන්ට්‍රි ලේඛනය සහ නිල නිවාස ලේඛනයද පළාත් කෘෂිකර්ම දෙපාර්තමේන්තුව විසින් හානි ලේඛනය සහ පොදු තැන්පත් ලේඛනයද විධිමත්ව හා යාවත්කාලීනව පවත්වා නොතිබුණු බව නිරීක්ෂණය විය.

(ඇ) තොරතුරු ඉදිරිපත් නොකිරීම.

-----------------------------------

පහත නිරීක්ෂණයන් කෙරේ.

i. ප්‍රධාන අමාත්‍යාංශය යටතේ ස්ථාපිත කර තිබුණු මාධ්‍ය ඒකකය පවත්වා ගෙන යාම සඳහා සමාලෝචිත වර්ෂයේදී සිදු කර තිබුණු රු.5,528,833 ක ගෙවීම්වල නිවැරදිතාවය සහ පළාත් සභාව ආරම්භයේ සිට සමාලෝචිත වර්ෂයේ අවසානය දක්වා එකී මාධ්‍ය ඒකකය සඳහා මිලට ගෙන තිබුණු විවිධ උපකරණවල වටිනාකම හෝ එකී භාණ්ඩවල පැවැත්ම තහවුරු කර ගැනීමට හැකි සමීක්ෂණ මණ්ඩල වාර්තා හා ඉන්වෙන්ට්‍රි ලේඛන විගණනයට ඉදිරිපත් නොවීය.

ii. 2014 දෙසැම්බර් 18 දින දී සහ ඉන්පසු විවිධ අවස්ථාවල ලිඛිතව හා වාචිකව 2014 වර්ෂයේ මූල්‍ය විගණනයට අත්‍යාවශ්‍ය තොරතුරු කැඳවන ලද නමුත් ප්‍රධාන අමාත්‍යාංශ කාර්ය මණ්ඩලය විසින් රු.8,003,983 ක් වූ ගෙවීම් වවුචර් 106 ක් ඇතුළු එකී තොරතුරු ලබාදීම ප්‍රමාද කිරීම හෝ පැහැර හැරීම හේතුවෙන් සමාලෝචිත වර්ෂයේ විගණනය 2015 අප්‍රේල් 24 දිනවන විටත් අවසන් කිරීමට නොහැකි විය.

iii. මාසික ගිණුම් සාරාංශ, සහභාගි වූවන්ගේ පැමිණීමේ ලේඛන හා වෙනත් තොරතුරු, විධිමත් ඉන්වොයිසි, ප්‍රතිලාභීන් පිළිබඳ විස්තර, තොග ලේඛන, ඡායාරූප, නිකුත් කිරීමේ නියෝග ආදී වූ අවශ්‍ය සාක්ෂි ප්‍රධාන අමාත්‍යාංශය සතුව නොතිබීම හේතුවෙන් සමාලෝචිත වර්ෂයේදී සිදුකර තිබුණු රු.148,911,967 ක් වූ ගනුදෙනු 36 ක් විගණනයේදී සතුටුදායක ලෙස සන්නිරීක්ෂණය කිරීමට නොහැකි විය.

iv. පැමිණීමේ හා පිටවීමේ ලේඛණ හා බිල්පත් ආදී වූ සාක්ෂි පළාත් කෘෂිකර්ම අමාත්‍යාංශය සතුව නොතිබීම හේතුවෙන් සමාලෝචිත වර්ෂයේදී සිදුකර තිබුණු රු.3,675,763 ක් වූ ගනුදෙනු නිවැරදි බව විගණනයේදී පිළිගත නොහැකි විය.

v. පළාත් පරිවාස දෙපාර්තමේන්තුව විසින් පාසල් ළමුන්, පරිවාසකයින් දැනුවත් කිරීම සඳහා පවත්වා තිබූණු වැඩසටහන් 35 කට අදාලව රු.2,177,035 ක් ගෙවා තිබුණු නමුත් එම වැඩසටහන් පැවැත්වීම පිළිබඳ තහවුරු සාක්ෂි කිසිවක් විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

2.2.7 නීති,රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම.

නියැදි විගණන පරීක්ෂණ වලදී නිරීක්ෂණය වූ නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණ විධිවිධානවලට අනුකූල නොවූ අවස්ථා විග්‍රහකර පහත දැක්වේ.

| නීති, රීති, රෙගුලාසියට යොමුව | | | අනුකූල නොවීම |
|---|---|---|---|
| (අ) | 1987 අංක 42 දරන පළාත් සභා පනත | | පනතේ විධි විධාන වලට අනුකූල නොවන ලෙස සභා නායක, විපක්ෂ නායක, ආණ්ඩු පක්ෂයේ ප්‍රධාන සංවිධායක සහ විපක්ෂයේ ප්‍රධාන සංවිධායක යන තනතුරු 04 ක් ඇති කර පළාත් සභා මන්ත්‍රීවරයෙකුට හිමි වරප්‍රසාද ඉක්මවූ වරප්‍රසාද ලබා දී තිබුණි. අදාල තනතුරුධාරීන් වෙත 2014 වර්ෂයේදී ලබාදී තිබුණු වරප්‍රසාද වෙනුවෙන් රු.6,461,136 ක් ගෙවා තිබුණු අතර ඉකුත් වර්ෂ දෙකේදී ලබාදී තිබුණු එකී වරප්‍රසාද වෙනුවෙන් රු.11,056,750 ක් ද ගෙවා තිබුණි. |
| (ආ) | ආයතන සංග්‍රහය | | |
| | XXIV පරිච්ඡේදයේ 4.2.5, 4.4 ,4.4.1,4.5 සහ 4.6 වගන්ති | 4,184,402 | 1992 වර්ෂයේ සිට 2014 වර්ෂය දක්වා කාලය තුල ආයුර්වේද දෙපාර්තමේන්තුවේ, පළාත් සෞඛ්‍ය සේවා දෙපාර්තමේන්තුවේ, පළාත් සෞඛ්‍ය අමාත්‍යාංශයේ සේවය කර මිය ගිය, විශ්‍රාම ගිය, සේවය අතහැර ගිය සහ වැඩ තහනම් කල නිලධාරීන් 95 දෙනෙකුගෙන් අයවිය යුතු ණය ශේෂ අය කරගෙන නොතිබුණි. |
| | XIX පරිච්ඡේදයේ 5.2 සහ 5.3 ඡේදය | 137,959 | පළාත් රෝහල් 03 ක නිවාසවල පදිංචි නිලධාරීන් හත් දෙනෙකුගෙන් නිවාස කුලී අය කරගැනීමට කටයුතු කර නොතිබුණි. |
| (ඇ) | උතුරු මැද පළාත් මූල්‍ය රීති 261.2.2 | 4,114,500 | අනුරාධපුර ප්‍රාදේශිය සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ කාර්යාලයේ හා පළාත් ප්‍රධාන අමාත්‍යාංශයේ මාණ්ඩලික නිලධාරීන් 06 දෙනෙකු වෙත රු.100,000 ක අත්තිකාරම් සීමාව ඉක්මවා අවස්ථා |

| | | | |
|---|---|---|---|
| | | | 07 ක දී අතුරු අග්‍රිම ගෙවා තිබුණු අතර එකී ආයතනවල මාණ්ඩලික නිලධාරින් වෙත පළමුව නිකුත් කර තිබුණු තත්කාර්ය අතුරු අග්‍රිම නිරවුල් කර නොතිබූ අවස්ථා 64 ක දී නැවත නැවත එම නිලධාරින්ට තත්කාර්ය අතුරු අග්‍රිම ගෙවා තිබුණි. |
| (ඇ) | මුදල් රෙගුලාසි | | |
| | 571 | 2,298,507 | පළාත් ආයුර්වේද දෙපාර්තමේන්තුවේ හා පළාත් ඉඩම් කොමසාරිස් දෙපාර්තමේන්තුවේ පොදු තැන්පත් ගිණුම්වල වර්ෂ 02 ඉක්ම වූ තැන්පතු සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි විධිවිධාන ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. |
| | 1645 (අ) | - | ප්‍රධාන ලේකම් කාර්යාලය, අභ්‍යන්තර විගණන හා විමර්ශන දෙපාර්තමේන්තුව, පළාත් සැලසුම් හා මෙහෙයුම් දෙපාර්තමේන්තුව විසින් ඒවාට අයත් වාහනවලට අදාල සියළු තොරතුරු සටහන් කර ලොග් පොත් විධිමත්ව පවත්වාගෙන ගොස් නොතිබුණි. |
| | 1646 | - | ප්‍රධාන ලේකම් කාර්යාලය, අභ්‍යන්තර විගණන හා විමර්ශන දෙපාර්තමේන්තුව, පළාත් සැලසුම් හා මෙහෙයුම් දෙපාර්තමේන්තුව විසින් ඒවායේ වාහනවලට අදාලව එක් එක් මාසයට අදාල දෛනික ධාවන සටහන් හා මාසික සාරාංශ ඊලඟ මාසයේ 15 දිනට පෙර විගණකාධිපති වෙත ඉදිරිපත් කර නොතිබුණි. |
| (ඉ) | 1990 ඔක්තෝබර් 10 දිනැති අංක 11/90 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය | | සියළුම වාහනවල ඉන්ධන දහනය මාස 06 කට වරක් පරීක්ෂා කළ යුතු වුවත්, පළාත් සභාවේ වාහනවල ඉන්ධන දහනය පරීක්ෂා කර නොතිබුණි. |

(ඊ) ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය

| | | |
|---|---|---|
| 2.8.1 (ආ) වගන්තිය | 4,028,260 | සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව විසින් ලැප්ටොප් පරිගණක 36 ක් හා බහු කාර්යය මුද්‍රණ යන්ත්‍ර 31 ක් මිලට ගැනීම සඳහා වූ තාක්ෂණ ඇගයීම් කමිටුවලට අදාල විෂය පිළිබඳ විශේෂඥ දැනුමක් ඇති සාමාජිකයෙකු ඇතුලත් වී නොතිබුණි. |

## 2.2.8 ප්‍රමාණවත් අධිකාරී බලයකින් තහවුරු නොවූ ගනුදෙනු

පහත සඳහන් කරුණු නිරීක්ෂණය විය.

(අ) දෙසැම්බර් 31 දිනට ඉතිරි වූ අග්‍රිම ශේෂය ඊළඟ වර්ෂයේ ජනවාරි 10 දිනට හෝ පළාත් භාණ්ඩාගාරය විසින් නියම කරනු ලබන දිනට පෙර ආපසු ගෙවිය යුතු වුවත් සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන සමඟ වූ සටහන් අනුව දෙසැම්බර් 31 දිනට අග්‍රිම ගිණුම් 18 ක නිරවුල් නොකල හර ශේෂයන්හි එකතුව රු.374,621,850 ක් විය. ඉන් සියයට 85 ක් වූ රු.318,744,139 ක ශේෂයක් පළාත් මාර්ග සංවර්ධන අධිකාරිය විසින් පියවිය යුතුව තිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන සමඟ වූ සටහන් ප්‍රකාරව රු.11,136,395 ක් වූ පළාත් අමාත්‍යාංශ/දෙපාර්තමේන්තු ඇතුළු ආයතන 12 ක් විසින් නිරවුල් නොකල අග්‍රිම ශේෂයන් අවුරුදු 04 ට අධික කාලයක සිට පැවත එමින් තිබුණු අතර, එකී ශේෂයන්හි නිවැරදිතාවය තහවුරු කර ගැනීමට එම ආයතනයන් සතුව ලිඛිත සාක්ෂි නොතිබුණි.

(ඇ) මූල්‍ය ප්‍රකාශන හා කාර්යය සාධන වාර්තාව සමඟ වූ සටහන 15 ප්‍රකාරව සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට පළාත් රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම් 08 ක එකතුව රු.2,165,429 ක් වූ බැර ශේෂයන් සහ වාණිජ අත්තිකාරම් ගිණුම් 02 ක එකතුව රු.6,008,357 ක් වූ බැර ශේෂයන් විය. මීට අමතරව පළාත් භාණ්ඩාගාරයේ විෂයය අංක 5000 දරන රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුමේ 2013 දෙසැම්බර් 31 දිනට වූ රු.590,398 ක බැර ශේෂය රු.659,308 ක් දක්වා රු.68,910 කින් සමාලෝචිත වර්ෂයේදී තවදුරටත් වර්ධනය වී තිබුණි.

(ඈ) පළාත් ආණ්ඩුකාරවර ලේකම් කාර්යාලයේ හා පළාත් සෞඛ්‍ය සේවා දෙපාර්තමේන්තුවේ පළාත් රාජ්‍ය නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම්වලට අදාල අවම ලැබීම් සීමාව වෙත රු.5,399,422 කින් ලඟා වී නොතිබුණු අතර පළාත් සමූපකාර සේවක කොමිෂන් සභාවේ හා පළාත් සෞඛ්‍ය සේවා දෙපාර්තමේන්තුවේ පළාත් රාජ්‍ය නිලධාරින්ට අත්තිකාරම් ගිණුම්වලට අදාල හර ශේෂයේ උපරිම සීමාව රු.15,557,594 කින් ඉක්මවා තිබුණි.

(ඉ) පළාත් ඉංජිනේරු දෙපාර්තමේන්තුව විසින් සමාලෝචිත වර්ෂයේදී මධ්‍යම රජයේ අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු වෙත සපයා තිබුණු ඉංජිනේරුමය උපදේශන කාර්යයන් වෙනුවෙන් ලැබී ඇති උපදේශන ගාස්තු වලින් පරිපාලන වියදම් දැරීමෙන් පසු ඉතිරිය පළාත් සභා අරමුදලට බැර නොකර පොදු තැන්පත් ගිණුමේ රඳවාගෙන තිබුණි. ඉන් රු.1,067,724 ක් විධිමත් අනුමැතියකින් තොරව දෙපාර්තමේන්තු නිලධාරීන් වෙත ගෙවා තිබුණු අතර පළාත් කර්මාන්ත සංවර්ධන දෙපාර්තමේන්තුවේ අළෙවි සංකීර්ණය ඉදිකිරීම් ව්‍යාපෘතියේ උපදේශන සේවා ඉටුකිරීම වෙනුවෙන් පෞද්ගලික ආයතනයකට රු.3,038,330 ක් පළාත් සභා අරමුදලින් ගෙවා තිබුණි.

(ඊ) පළාත් සභාවේ සභාපතිවරයා හා උපසභාපතිවරයා විසින් සභාපතිවරයාට හා උපසභාපතිවරයාට හිමි පෞද්ගලික නිල කාර්ය මණ්ඩලයට අමතරව මන්ත්‍රීවරයෙකුට හිමි පෞද්ගලික කාර්ය මණ්ඩල සඳහා ද අදාල වැටුප් හා දීමනා ලෙස රු.1,515,120 ක් ලබාගෙන තිබුණි.

03. ආදායම් කළමනාකරණය.

---------------------------

පළාත් සභාව විසින් ආදායම් ශීර්ෂ 23 ක් යටතේ රු.2,751,657,246 ක ආදායමක් සමාලෝචිත වර්ෂයේදී රැස්කර තිබුණි. එය ඉකුත් වර්ෂයේ රු.2,326,770,418 ක් වූ ආදායම සමඟ සැසඳීමේදී සියයට 18 ක එනම් රු.424,886,828 ක වර්ධනයක් පෙන්නුම් කර තිබුණි. වර්ධනය එසේම සමාලෝචිත වර්ෂයේ ශීර්ෂ 23 යටතේ වූ එකී ආදායම පළාත් සභාවේ මුළු ආදායමින් සියයට 21 ක් වූ අතර එම ප්‍රතිශතය ඉකුත් වර්ෂයේ සියයට 23 ක් විය. ප්‍රධාන ආදායම් ශීර්ෂයන් කිහිපයක් පිළිබඳ විගණන නිරීක්ෂණයන් පහත දැක්වේ.

| ආදායම් ශීර්ෂ අංකය හා විස්තරය | ඇස්තමේන්තුගත ආදායම | තථ්‍ය ආදායම | වැඩිවීම (අඩුවීම) | නිරීක්ෂණ |
|---|---|---|---|---|
| | රු. | රු. | රු. | |
| 10.02.05.04 මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුව විසින් මෝටර් රථ ලියාපදිංචි ගාස්තු පැවරීම. | 50,000,000 | 104,860,533 | 54,860,533 | ඇස්තමේන්තුගත ආදායම රු.54,860,533 කින් ඉක්මවා ආදායම් රැස්කර තිබුණු බැවින් ඇස්තමේන්තු කිරීම තාත්වික හා නිවැරදි නොවන බව නිරීක්ෂණය විය. |
| 10-02-07-00- මුද්දර ආදායම | 200,000,000 | 394,540,996 | 194,540,996 | සියයට 97 කින් ඇස්තමේන්තු ආදායම ඉක්මවා මුද්දර ආදායම රැස්කර තිබුණි. |
| 20-02-02-03 – ආයෝජන පොලී | 35,000,000 | 85,121,577 | 50,121,577 | ඇස්තමේන්තුගත ආදායම රු.50,121,577 කින් ඉක්මවා ආදායම් රැස්කර තිබුණු බැවින් ඇස්තමේන්තු කිරීම තාත්වික හා නිවැරදි නොවන බව නිරීක්ෂණය විය. |
| 10.02.12.00 ජාතිය ගොඩනැගීමේ බදු | 1,500,000,000 | 1,038,138,168 | (461,861,832) | ඇස්තමේන්තුගත ආදායමට ලඟා නොවීම සියයට 31 ක් විය. |
| 10.03.07.09 වෙනත් බලපත්‍ර ගාස්තු | 800,000 | 91,350 | (708,650) | ඇස්තමේන්තුගත ආදායමට ලඟා නොවීම සියයට 89 ක් විය. |
| 20.03.02.99 විවිධ ලැබීම් | 33,000,000 | 121,612,690 | 88,612,690 | ඇස්තමේන්තුගත ආදායම රු.88,612,690 කින් ඉක්මවා ආදායම් රැස්කර තිබුණු බැවින් ඇස්තමේන්තු කිරීම තාත්වික හා නිවැරදි නොවන බව නිරීක්ෂණය විය. |
| 10-02-09-00- ව්‍යාපාර පිරිවැටුම් බද්ද | 7,000,000 | 13,822,738 | 6,822,738 | සමාලෝචිත වර්ෂයේ තථ්‍ය ව්‍යාපාර පිරිවැටුම් බදු ආදායම ඇස්තමේන්තුගත ආදායම සියයට 97 කින් ඉක්මවා තිබුණි. |
| 10-02-04-05 - මෙරට මත්පැන් බලපත්‍ර ගාස්තු | 25,000,000 | 46,981,760 | 21,981,760 | සමාලෝචිත වර්ෂයේ තථ්‍ය ආදායම ඇස්තමේන්තුගත ආදායම සියයට 88 කින් ඉක්මවා තිබුණි. |
| 10-02-07-01 දේපල පැවරීම මත මුද්දර ගාස්තු | 65,000,000 | 79,407,368 | 14,407,368 | ඇස්තමේන්තුගත ආදායම සියයට 22 කින් ඉක්මවා සමාලෝචිත වර්ෂයේදී ආදායම් රැස්කර තිබුණි. |
| 20-03-03-01 උසාවි දඩ | 190,000,000 | 144,216,403 | 45,783,597 | ඇස්තමේන්තුගත ආදායමට වඩා සියයට 15 කින් සමාලෝචිත වර්ෂයේ තථ්‍ය ආදායම පහත වැටී තිබුණි. |

| | | | | |
|---|---|---|---|---|
| 20.03.02.30 ඛනිජ බදු ආදායම | 5,000,000 | 5,131,586 | 131,586 | භාණ්ඩාගාරය සෘජුවම ප්‍රේෂණය කර තිබුණු රු.726,021 ක් ආදායම් ගිණුම පිළියෙල කිරීමේදී සැලකිල්ලට ගෙන නොතිබුණි. |
| 20.03.02.27 ඖෂධ හා රසායන බද්ද | 130,000 | 425,263 | 295,263 | බදු ගෙවන්නන් පිළිබඳ තොරතුරු ආදායම් ගණන්දීමේ නිලධාරියා සතුව නොතිබුණි. |

පහත නිරීක්ෂණයන්ද කරනු ලැබේ.

(අ) පළාත් මූල්‍ය රීති 41.1.4 ප්‍රකාරව හැකිතාක් තාත්වික හා නිවැරදි ලෙස ඇස්තමේන්තු පිළියෙල කිරීමට කටයුතු කලයුතු වුවත් ණය හා අත්තිකාරම් පොලී ආදායම් ඇස්තමේන්තු කිරීමේදී එක් එක් වර්ෂවල නිලධාරීන්ගේ ශ්‍රේණි අනුව ලබා දී ඇති ණය හා අත්තිකාරම් සහ නැවත ණය හා අත්තිකාරම් ගෙවීම් කලහැකි ප්‍රමාණයන් සැලකිල්ලට ගෙන සමාලෝචිත වර්ෂයේ විය හැකි තථ්‍ය හර ශේෂය මත පොලිය ගණනය කර ඇස්තමේන්තු පිළියෙල නොකර කිසිදු පදනමකින් තොරව ඉකුත් වර්ෂවල තථ්‍ය ආදායම් සැලකිල්ලට ගෙන ඇස්තමේන්තු සකස්කර තිබුණු බව විගණනයේදී නිරීක්ෂණය වීය.

(ආ) පළාත් සභාව ආරම්භ කර අවුරුදු 25 ක් ඉක්ම ගොස් ඇතත් පළාත තුල පිහිටි උගස් මධ්‍යස්ථාන නියමානුකූල කර ඒවා ලියාපදිංචි කිරීමේ හා වාර්ෂික බලපත්‍ර නිකුත් කිරීමේ ගාස්තු අයකිරීමට අදාල ප්‍රඥප්තියක් අනුමත කරගෙන නොතිබුණි. උගස් මධ්‍යස්ථාන ලියාපදිංචි කිරීම, වාර්ෂික බලපත්‍ර නිකුත් කිරීම සහ ඒවාට අදාල ගාස්තු අයකිරීම පිළිබඳ උපදෙස් පළාත් සභාව විසින් ලබාදී නොමැති නිසා එකී කටයුතු සිදුකල නොහැකි බවත් ප්‍රාදේශීය ලේකම්වරුන් විසින් වාර්තා කර තිබුණි.

(ඇ) පළාත් ආදායම් දෙපාර්තමේන්තුව විසින් අධිකරණ දඩ අයකිරීම සඳහා උතුරු මැද පළාත තුල ඇති අධිකරණ වෙත එන්සී - 100 ආකෘති පත්‍ර නිකුත් කර ඇති නමුත්, එම පොත්වලින් අයකල දඩ පිළිබඳව පරීක්ෂා කිරීමක් සිදුකර නොතිබුණි. එකී හේතුව නිසා අධිකරණයන් විසින් ප්‍රේෂණය කරන ලද දඩ මුදල් ප්‍රමාණයේ නිවැරදිතාවය පිළිබඳ සෑහීමකට පත්විය නොහැකි වූ අතර පාවිච්චි කල රිසිට් පොත් ආපසු ලබා ගැනීමකින් තොරව නැවත රිසිට් පොත් නිකුත් කර තිබූ බව විගණනයේදී නිරීක්ෂණය විය.

(ඈ) පළාත් ඉඩම් කොමසාරිස් දෙපාර්තමේන්තුව විසින් බදු අයවිය යුතු ඉඩම් ප්‍රමාණය හා අයවිය යුතු බදු ප්‍රමාණය පිළිබඳ විස්තර ඇතුළත් ලේඛන පවත්වාගෙන ගොස් නොතිබීම හේතුවෙන් ඉඩම් බදු ආදායම නිශ්චිතව ඇස්තමේන්තු කිරීමට නොහැකි වී තිබුණු අතර වර්ෂ අවසානයට හිඟ බදු ආදායම ගණනය කර ගැනීමටද නොහැකි වී තිබුණි.

(ඉ) පළාත් සභා මුදල් ප්‍රකාශය අනුව වන සත්ත්ව හා වෘක්ෂලතා ආදායම් ශීර්ෂයේ ඇස්තමේන්තුගත ආදයම රු.30,000,000 ක් වූ නමුත් ආදායම් ගිණුම අනුව ඇස්තමේන්තුගත ආදායමක් දක්වා නොතිබුණු අතර තථ්‍ය ආදායමක්ද නොවීය. එසේ වුවද භාණ්ඩාගාර පොත් අනුව රු.24,700 ක තථ්‍ය ආදායමක් විය.

(ඊ) එක් එක් ප්‍රාදේශීය ලේකම් බල ප්‍රදේශවල ලියාපදිංචි මත්පැන් බලපත්‍රලාභීන් සංඛ්‍යාව එක් එක් වර්ෂවල රැස්කල යුතු බලපත්‍ර ගාස්තු ආදායම් ප්‍රමාණය, ප්‍රාදේශීය ලේකම් කාර්යාල විසින් දෙපාර්තමේන්තුවට ප්‍රේෂණය කල ආදායම හා ප්‍රේෂණය නොකර රඳවාගත් ආදායම සහ බලපත්‍ර වාර්ෂිකව අළුත් නොකල බලපත්‍රලාභීන් සංඛ්‍යාව යනාදී විස්තර ලබාගත හැකිවන ආකාරයට මත්පැන් බලපත්‍රලාභීන්ගේ ලේඛනයක් පළාත් ආදායම් දෙපාර්තමේන්තුව විසින් පිළියෙල කර යාවත්කාලීනව නඩත්තු කර නොතිබුණි.

## 04 මූල්‍ය සමාලෝචනය

-----------------------

### 4.1 මූල්‍ය ප්‍රතිඵල

----------------

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2014 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා පළාත් සභා අරමුදලේ රු.63,101,757 ක ඌණතාවයක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ ඌණතාවය රු.102,194,257 ක් විය.

### 4.2 විග්‍රහාත්මක මූල්‍ය සමාලෝචනය

-------------------------------------

ඉකුත් වර්ෂය හා සැසඳීමේදී සමාලෝචිත වර්ෂයේ පුනරාවර්තන වියදම රු.1,880,473,663 කින් වැඩිවී සහ රජයේ මූලධන ප්‍රදාන රු.1,663,962,685 කින් අඩුවී ඇතත් මූල්‍ය ප්‍රතිඵලය රු.39,092,500 කින් වර්ධනය වී තිබුණු අතර ඒ සඳහා රජයේ පුනරාවර්තන ප්‍රදාන රු.2,829,258,000 ක හා බදු ආදායම රු.379,422,737 ක වැඩිවීම ප්‍රධාන වශයෙන් බලපා තිබුණි.

05. අධිකාරී ගිණුම්/අරමුදල් ගිණුම් හා වාණිජ අත්තිකාරම් ගිණුම්

5.1 අධිකාරී ගිණුම්/අරමුදල් ගිණුම්

උතුරු මැද පළාත් සභාව විසින් අනුමත කල ප්‍රඥප්ති යටතේ අධිකාරී 05 ක් පිහිටුවා ඇති අතර අරමුදල් 07 ක් ආරම්භ කර ඇත. විස්තර පහත දැක්වේ.

5.1.1 උතුරු මැද පළාත් මාර්ග සංවර්ධන අධිකාරිය

සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් පහත කරුණු නිරීක්ෂණය විය.

(අ) සම්පූර්ණයෙන්ම ක්ෂය කර ඇතත් සමාලෝචිත වර්ෂයේදීද ප්‍රයෝජනයට ගෙන තිබුණු පිරිවැය රු.1,640,000 ක් වූ වාහන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත අංක 16 ප්‍රකාර ප්‍රත්‍යාගණනය කර එකී වටිනාකම් සහ අධිකාරිය සතු ඉඩම්වල වටිනාකම තක්සේරුකර එකී වටිනාකම් මූල්‍ය ප්‍රකාශනවල දක්වා නොතිබුණි.

(ආ) කල්බදු වාරික ගෙවා අවසන් කර තිබුණු කැබ් රථ 02 ක රු.2,278,260 ක් වූ වටිනාකම කල්බදු ණයහිමියාගෙන් අඩුකර දක්වා නොතිබුණි.

(ඇ) බැංකු කුවිතාන්සි අනුව සමාලෝචිත වර්ෂයේදී රු. මිලියන 31 ක් ස්ථාවර තැන්පතුවල ආයෝජනය කර තිබුණු අතර වර්ෂය තුල ස්ථාවර තැන්පතු, මුදල් කර නොතිබුණු නමුත් වර්ෂය ආරම්භයේ වූ රු. මිලියන 150 ක ස්ථාවර තැන්පතු ප්‍රමාණයම සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනවලද දක්වා තිබීම හේතුවෙන් රු. මිලියන 31 ක් මූල්‍ය ප්‍රකාශනවල අඩුවෙන් දක්වා තිබුණි.

(ඈ) යාවත්කාලීන කල පොදු ලෙජරය හා ජ'නලය, 2014 දෙසැම්බර් 31 දිනට වූ රු.1,910,442 ක මුළු ජංගම බැරකම් ඇතුලත් කර පිළියෙල කල බැරකම් ප්‍රකාශය, යාවත්කාලීන කල ස්ථාවර වත්කම් ලේඛනය, සියළු ආදායම් රැස්කල ආකාරය දැක්වෙන ආදායම් ගිණුම්, යාවත්කාලීන කල පොදු තැන්පතු ලේඛනය යාවත්කාලීන කල ස්ථාවර තැන්පතු ලේඛනය යනාදිය විධිමත්ව පවත්වා ගෙන ගොස් නොතිබීම සහ ඒවාට අදාල තොරතුරු ඉදිරිපත් නොකිරීම නිසා මූල්‍ය ප්‍රකාශන විගණනයේදී ප්‍රමාණවත් හා උචිත සාක්ෂි රැස්කර ගැනීමට නොහැකි විය.

5.1.2 උතුරු මැද පළාත් පූර්ව ළමාවිය සංවර්ධන අධිකාරිය

---

සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් පහත කරුණු නිරීක්ෂණය විය.

(අ) ටික්කි ටිකිරි හා සිරුවම් අමුදම් යන පුවත්පත් 226,927 ක් අලෙවියෙන් ලැබුණු රු.3,200,370 ක මුදල සඳහා මුදල් රෙගුලාසි 165 හා 168 විධිවිධාන ප්‍රකාරව කුවිතාන්සි නිකුත්කර මාණ්ඩලික නිලධාරියෙකුගේ අධීක්ෂණය යටතේ ලේඛන ගත කර නොතිබුණි. එසේම එකී පුවත්පත මුද්‍රණය, බෙදාහැරීම හා අලෙවිය සම්බන්ධ ප්‍රමාණවත් විස්තර ආයතනය සතුව නොතිබුණි.

(ආ) අධිකාරියේ සභාපතිවරයා විසින් 2014 වර්ෂයේ අවසාන මාස 03 සඳහා ගුරු දීමනා ගෙවීමට ලබාගෙන තිබුණු රු.900,000 ක මුදල අදාල පාර්ශව වෙත නොගෙවා ඔහුගේ පෞද්ගලික පරිහරණය සඳහා යොදා ගෙන තිබුණි.

(ඇ) අධිකාරියේ පුනරාවර්තන වියදම් සඳහා ප්‍රධාන අමාත්‍යාංශය විසින් ලබා දී තිබුණු මුදලින් රු.2,397,910 ක් ජනාධිපති ආර්යාව පැමිණි උත්සවයකට හා ජනාධිපතිතුමාට සමරු තිළිණ පිරිනැමීමේ උත්සවයක් සඳහා වියදම් කර තිබුණු අතර ඒ සඳහා අනුමැතිය ලබාගෙන නොතිබුණි. එසේම එකී වියදම් තහවුරු කිරීම සඳහා ප්‍රමාණවත් බිල්පත් විගණනයට ඉදිරිපත් නොවීය.

5.1.3 උතුරු මැද පළාත් සංවර්ධන නිර්මාණ හා යන්ත්‍රෝපකරණ ඒජන්සිය

---

ඒජන්සිය විසින් සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන විගණනය සඳහා ඉදිරිපත් කර නොතිබුණු අතර ගනුදෙනු විගණනයේදී අනාවරණය වූ නිරීක්ෂණයන් පහත දැක්වේ.

(අ) ප්‍රසම්පාදන මාර්ගෝපදේශ 2.8.1 (අ) (ආ) සහ (ඇ) හි විධිවිධාන ප්‍රකාරව විධිමත් ප්‍රසම්පාදන සහ තාක්ෂණ ඇගයීම් කමිටුවක අනුමැතියෙන් සහ ආයතනයේ අධ්‍යක්ෂ මණ්ඩලයේ අනුමැතියෙන් තොරව රු.1,225,000 ක් වූ ඩිජිටල් මුද්‍රණ යන්ත්‍රයක් 2013 ඔක්තෝබර් මාසයේදී මිලට ගෙන තිබුණි. යන්ත්‍රය සවිකර කෙටි කාලයකින් අළුත්වැඩියා කිරීමට සිදුවීමෙන් එය යම් ආයතනයක් පරිහරණය කර ගලවා ඉවත් කර තිබුණු යන්ත්‍රයක් බව අනාවරණය විය.

(ආ) 2002 වර්ෂයට පෙර කාලපරිච්ඡේදයන් වෙනුවෙන් දේශීය ආදායම් දෙපාර්තමේන්තුවට ප්‍රේෂණය කළ යුතු රු.1,174,400 ක ව්‍යාපාර පිරිවැටුම් බදු සහ භාණ්ඩ හා සේවා බදු නියමිත පරිදි ප්‍රේෂණය කර නොතිබිම නිසා එම මුදල් අය කර ගැනීමට දේශීය ආදායම් දෙපාර්තමේන්තුව විසින් කොළඹ දිසා අධිකරණයේ නඩු පවරා තිබුණි.

(ඇ) 2002 අංක 14 දරණ එකතු කළ අගය මත බදු පනත යටතේ 2002 වර්ෂයේ සිට 2014 වර්ෂය දක්වා කාලපරිච්ඡේදයේ ආයතනය විසින් එක් රැස් කර තිබුණු රු.18,165,671 ක එකතු කළ අගය මත බදු දේශිය ආදායම් කොමසාරිස් ජනරාල්වරයා වෙත ප්‍රේෂණය කර නොතිබුණි.

(ඈ) 2009 වර්ෂයේ සිට 2014 වර්ෂය දක්වා කාලපරිච්ඡේදයට අදාල රු.3,109,880 ක් වූ සේවක අර්ථ සාධක අරමුදලේ දායක මුදල් 1958 අංක 15 දරන සේවක අර්ථ සාධක අරමුදල් පනතේ 10(1) සහ (2) වගන්තිවල විධිවිධාන ප්‍රකාරව එම අරමුදලට ප්‍රේෂණය කර නොතිබීම හේතුවෙන් රු.1,683,200 ක අධිභාරයක් පනවා තිබුණි.

(ඉ) සේවාදායක ආයතනය සමඟ ගිවිසුමකට එළඹීමෙන් තොරව 2014 වර්ෂයේදී අනුරාධපුර දිස්ත්‍රික්කයේ වැව් ආශ්‍රිතව පානීය ලිං 304 ක් හෑරීම සඳහා රු.4,890,160 ක් වූ යන්ත්‍ර පැය 735 ක් වැඩ කර තිබුණද අතර අදාල සේවාදායක ආයතනය මෙම කාර්යය ඉටු කිරිම වෙනුවෙන් රු.2,161,427 ක් පමණක් ගෙවීමක් කර තිබීම හේතුවෙන් ඒජන්සියට රු.2,728,733 ක පාඩුවක් සිදු වී තිබුණි.

5.1.4 උතුරු මැද පළාත් කර්මාන්ත සංවර්ධන අධිකාරිය

අධිකාරියට අදාල සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් පහත කරුණු නිරීක්ෂණය විය.

(අ) 2014 වර්ෂයේ දී කර්මාන්ත සංවර්ධන අධිකාරියේ අලෙවි භාණ්ඩ සංචාරක හෝටල්වල තැබීම සඳහා රු.133,333 ක වියදමින් වීදුරු ලී අල්මාරි 10 ක් සාදවා තිබුණි. ඉන් 06 ක් සංචාරක හෝටල් වල ද, එක් අල්මාරියක් කර්මාන්ත සංවර්ධන අධිකාරියට අයත් කාර්යාල පරිශ්‍ර අලෙවිසැලේද ඉතිරි අල්මාරි 03 කාර්යාල පරිශ්‍රයේ එළිමහනේ අනාරක්ෂිතව ද තබා තිබුණු අතර එකී සියළුම අල්මාරි අධිකාරියේ වත්කම් වශයෙන් ගිණුම් ගත කිරීමටද කටයුතු කර නොතිබුණි.

(ආ) 2010 සහ 2011 වර්ෂවලදී ප්‍රතිලාභීන් 126 දෙනෙකු වෙත ගෙවා තිබුණු රු.3,387,940 ක් වූ කම්හල් උපකරණ ණය, වායු පීඩන යන්ත්‍ර ණය, බහුකාර්ය ලී වැඩ යන්ත්‍ර ණය, ස්වයං රැකියා ණය සහ පා පැදි ණය වලින් රු.1,450,453 ක් හිඟ හිට තිබුණි.

5.1.5 උතුරු මැද පළාත් මාර්ගස්ථ මගී ප්‍රවාහන සේවා අධිකාරිය

---

අධිකාරියට අදාල සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් පහත නිරීක්ෂණයන් විය.

(අ) 2008 ජුනි 26 දිනැති අංක 14/2008 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය ප්‍රකාරව මාසික ප්‍රවාහන දීමනාව රු.30,000 ක් වුවත් එකී දීමනාව රු.40,000 බැගින් ලබාදීම හේතුවෙන් අධිකාරියේ සභාපතිවරයාට රු.120,000 ක් හා සාමාන්‍යාධිකාරීවරයාට රු.20,000 වශයෙන් එකතුව රු.140,000 ක් සමාලෝචිත වර්ෂයේදී වැඩිපුර ගෙවා තිබුණි.

(ආ) 2011 පෙබරවාරි 09 දිනැති අංක 13/2008/(iv) දරන චක්‍රලේඛයෙන් සංශෝධිත 2008 ජුනි 26 දිනැති අංක 13/2008 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය ප්‍රකාරව මාසික ඉන්ධන දීමනාව ලීටර් 140 ක් වුවත් ලීටර් 170 බැගින් ලබා දීම හේතුවෙන් අධිකාරියේ සභාපතිවරයාට හා සාමාන්‍යාධිකාරීවරයාට පිළිවෙලින් රු.57,978 ක් හා රු.14,607 ක් සමාලෝචිත වර්ෂය තුල දී වැඩිපුර ගෙවා තිබුණි. එකී ඉන්ධන ප්‍රමාණයට අමතරව ප්‍රධාන ලේකම්වරයාගේ පෞද්ගලික අනුමැතිය නොමැතිව ලබාගෙන තිබුණු ඉන්ධන වෙනුවෙන් පිළිවෙලින් අවස්ථා 06 කදී හා 03 කදී එකතුව රු.58,431 ක් හා රු. 25,887 ක් ද ගෙවා තිබුණි.

5.1.6 උතුරු මැද පළාත් පාරිසරික අධිකාරිය

---

2012 ජනවාරි මාසයේදී පිහිටුවා ඇති මෙම අධිකාරියට අදාල සමාලෝචිත වර්ෂයේ හා ඉකුත් වර්ෂවල මූල්‍ය ප්‍රකාශන විගණකාධිපති වෙත ඉදිරිපත් කර නොතිබුණි.

5.1.7 උතුරු මැද පළාත් හදිසි අවස්ථා අරමුදල

---

සමාලෝචිත වර්ෂය සඳහා වූ අරමුදලේ මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් අනාවරණය වූ ප්‍රධාන නිරීක්ෂණයන් පහත දැක්වේ.

(අ) අරමුදල ආරම්භ කල 1990 වර්ෂයේ සිට එකී අරමුදලේ අරමුණු ඉටුකර ගැනීම සඳහා කිසිම කාර්යයක් සිදුකර නොතිබුණි.

(ආ) අරමුදල පිහිටුවා අවුරුදු 24 ක් ඉක්ම ගොස් ඇතත් ප්‍රඥප්තියේ 20 (3) ප්‍රකාරව මෙම අරමුදල ක්‍රියාත්මත කිරීමට අවශ්‍ය රීති ආණ්ඩුකාරවරයා විසින් පිළියෙල කර නොතිබුණි.

5.1.8 උතුරු මැද පළාත් ප්‍රධාන අමාත්‍ය අරමුදල

---

සමාලෝචිත වර්ෂය හා ඉකුත් වර්ෂ 02 කට අදාල මූල්‍ය ප්‍රකාශන විගණකාධිපති වෙත ඉදිරිපත් කර නොතිබුණු අතර සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට අරමුදලේ රු.5,185,974 ක් විය.

5.1.9 උතුරු මැද පළාත් දිරිදීමනා අරමුදල

---

අරමුදලට අදාල සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් පහත කරුණු නිරීක්ෂණය විය.

(අ) ප්‍රතිපාදන ලැබීම් ලෙස දක්වා ඇති රු.6,694,950 ක මුදල 2011 දෙවන අර්ධ වර්ෂය සහ 2014 ප්‍රථම අර්ධ වර්ෂය සඳහා වුවත් සටහන් මගින් හෝ එක් එක් අර්ධ වර්ෂයට අදාල මුදල වෙන වෙනම අනාවරණය කර නොතිබුණි.

(ආ) 2011 අර්ධ වර්ෂයේදී ගෙවා ඇති රු.3,216,116 ක් වූ දිරි දීමනා සැදී ඇති ආකාරය සටහන් මගින් හෝ ඉදිරිපත් කර නොතිබුණි.

5.1.10 උතුරු මැද පළාත් ග්‍රාම සංවර්ධන අරමුදල

(අ) 2011 අංක 03 දරන උතුරු මැද පළාත් ග්‍රාම සංවර්ධන ප්‍රඥප්තියේ 26 වන වගන්තිය ප්‍රකාරව 2012 ජනවාරි මාසයේදී මෙම අරමුදල ආරම්භ කර තිබුණි. පළාත් සභා අරමුදලින් කෙරෙන කවර විෂයයකට අදාල කටයුත්තක් වුවද, විගණනය කිරීම ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 ව්‍යවස්ථාවෙන් සහ 1987 අංක 42 දරන පළාත් සභා පනතේ 23(1) හා 23(2) වගන්ති වලින් විගණකාධිපතිවරයා වෙත පැවරී ඇතත් මෙම අරමුදලේ මූල්‍ය ප්‍රකාශන විගණකාධිපති විසින් විගණනය සිදුකල යුතු බවට විධිවිධාන ප්‍රඥප්තියට ඇතුලත් කර නොතිබුණි. ප්‍රඥප්තියේ 26 (2) වගන්තිය ප්‍රකාරව මෙම අරමුදල 1987 අංක 42 දරන පළාත් සභා පනතේ 3 කොටසේ විධි විධානවලට අනුකූල විය යුතු බැවින් අරමුදල විගණනය විගණකාධිපති විසින් සිදුකල යුතුව ඇත. එමනිසා මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර විගණකාධිපති වෙත ඉදිරිපත් කල යුතු වුවත් අරමුදල ආරම්භ කල වර්ෂයේ සිට සමාලෝචිත වර්ෂය දක්වා වූ අරමුදලේ මූල්‍ය ප්‍රකාශන විගණකාධිපති වෙත ඉදිරිපත් කර නොතිබුණි.

(ආ) ග්‍රාම සංවර්ධන අරමුදලින් ග්‍රාම ප්‍රබෝධනි අවුරුදු වැඩසටහන, පුලතිසි මංගල සිහිනය සහ ග්‍රාම සංවර්ධන වර්ණ කොඩි මුද්‍රණය වෙනුවෙන් එකතුව රු.2,000,000 ක වියදම් දරා තිබුණු නමුත් එම වියදම් දැරීම සම්බන්ධ තීරණ ගැනීමේදි කිසිදු තීරණයකට ග්‍රාම සංවර්ධන අරමුදලේ සභාපති වශයෙන් අමාත්‍යාංශ ලේකම්ගේ ලිඛිත එකඟතාවය ලබාගෙන නොතිබුණි.

5.1.11 උතුරු මැද පළාත් අධ්‍යාපන සංවර්ධන අරමුදල

පහත සඳහන් කරුණු නිරීක්ෂණය විය.

(අ) 2005 ජනවාරි මාසයේදී ආරම්භ කර ක්‍රියාත්මක කර තිබුණු මෙකී අරමුදලේ සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට රු.8,331,893 ක ශේෂයක් විය. 2004 ජූනි 23 වන දිනැති අංක 1346/8 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අති විශේෂ ගැසට් පත්‍රයේ 8 (1) ඡේදය සහ උතුරු මැද පළාත් මූල්‍ය රීති 372.1 ප්‍රකාර අරමුදල ආරම්භක වර්ෂයේ සිට සමාලෝචිත වර්ෂය දක්වා වූ මූල්‍ය ප්‍රකාශන විගණකාධිපති වෙත ඉදිරිපත් කර නොතිබුණි.

(ආ) අධ්‍යාපන සංවර්ධන අරමුදලේ මූල්‍ය තත්ත්වය වර්ධනය කර ගැනීම සඳහා ලොතරැයිපත් 1,800,000 ක් විදුහල්පතිවරුන් වෙත විධිමත් පරිදි භාර දී තිබුණ ද දිඹුලාගල, පොළොන්නරුව හා හිඟුරක්ගොඩ කලාපවල පාසල් 94 ක විදුහල්පතිවරුන් විසින් භාරගත් රු. 4,993,000 ක් වටිනාකමින් යුත් ටිකට් පොත් 24,965 කින් කිසිදු ටිකට්පතක් විකුණා නොතිබුණු අතර එම ටිකට් පොත් නැවත අමාත්‍යාංශය වෙත භාර දීම ද සිදුකර නොතිබුණි.

5.2 වාණිජ අත්තිකාරම් ගිණුම්

5.2.1 රජරට එෆ්.එම්.සේවා අත්තිකාරම් ගිණුම

පහත සඳහන් කරුණු නිරීක්ෂණය විය.

උතුරු මැද පළාත් සභාව හා ගුවන් විදුලි සංස්ථාව අතර ගුවන් කාලය වෙන්කිරීම වෙනුවෙන් 2011 මැයි 06 දින ඇති කරගත් ගිවිසුම 2014 ජනවාරි 31 දින අහෝසි කරන බව ගුවන් විදුලි සංස්ථාවේ සභාපතිවරයා දැනුම් දී තිබියදීත් 2014 ජනවාරි 01 දින නිලධාරීන් 05 කු බඳවා ගෙන තිබුණු අතර එකී නිලධාරීන් වෙත මසකට රු.40,000 බැගින් මාස 03 ක කාලයක් සඳහා රු.120,000 ක් ගෙවීමට 2014 මාර්තු 14 දින අමාත්‍යාංශ ලේකම්වරයා අනුමැතිය ලබාදී තිබුණි. රජරට එෆ්.එම්. හි සම්බන්ධීකාරකවරයාගේ 2014 ජනවාරි 03 දිනැති ලිපියට අමාත්‍යාංශ ලේකම්වරයා කඩිනමින් ප්‍රතිචාර දැක්වූයේ නම් අදාල පත්වීම් බල රහිත කර අවිධිමත්ව ගෙවූ ඉහත රු.120,000 ක මුදල ගෙවීම වලක්වා ගැනීමට හැකියාව තිබුණු බව විගණනයේදී නිරීක්ෂණය විය.

5.2.2 තාර මිලට ගැනීමේ අත්තිකාරම් ගිණුම

සමාලෝචිත වර්ෂයේ මෙම වාණිජ අත්තිකාරම් ගිණුම සම්බන්ධයෙන් පහත සඳහන් කරුණු නිරීක්ෂණය විය.

(අ) 2014 ජනවාරි 01 දිනට අයවිය යුතුව තිබුණු රු.26,465,683 ක් වූ ණයගැති ශේෂයෙන් වර්ෂය තුල අයකර ගෙන තිබුණේ සියයට 43 ක් හෙවත් රු.11,357,380 ක් පමණි.

(ආ) සමාලෝචිත වර්ෂයේ රු.13,153,518 ක් වූ මුළු තාර විකුණුම් වලින් වර්ෂය තුල මුදලින් රැස්කර තිබුණේ සියයට 8 ක් වූ රු.1,013,907 ක් පමණි.

(ඇ) තාර අත්තිකාරම් ගිණුම පවත්වා ගැනීමේ අරමුණු නිශ්චිතව පැහැදිලි කිරීමට අධිකාරිය අපොහොසත් වූ අතර, වාණිජ අත්තිකාරම් ගිණුමක් ලෙස මෙම ගිණුම හඳුනාගෙන තිබුණි. පිරිවැයට සියයට 10 ක ප්‍රතිශතයක් සහිතව මිල කල තාර මාර්ග නඩත්තු වෙනුවෙන් කොන්ත්‍රාත්කරුවන් වෙත ලබාදීම මත සත්‍ය ලෙසම උපලබ්ධි නොවූ ලාභයක් ගිණුම තුලින් පෙන්වීමට අධිකාරිය උත්සාහ දරා තිබුණි.

5.2.3 තත්ත්ව පාලන අත්තිකාරම් ගිණුම

---

සමාලෝචිත වර්ෂයේ මෙම වාණිජ අත්තිකාරම් ගිණුම සම්බන්ධයෙන් පහත කරුණු නිරීක්ෂණය විය.

(අ) පළාත් ඉංජිනේරු දෙපාර්තමේන්තුවේ තත්ත්ව පාලන ඒකකයේ අරමුදලින් මිලට ගෙන ඇති ස්ථාවර වත්කම්වල වටිනාකම ගිණුම්වලින් අනාවරණය කර නොතිබුණි.

(ආ) අත්තිකාරම් ගිණුම් කටයුත්තේ විෂය පථය යටතේ නොගැනෙන රු.64,960 ක් වූ ඉංජිනේරු සංගමයේ සංචාරක ගාස්තු ගෙවීම් අත්තිකාරම් ගිණුමට හර කර තිබුණි.

(ඇ) කැකිරාව, ලංකා බැංකුවේ පවත්වාගෙන යනු ලබන ජංගම ගිණුමක 2014 ජූලි සිට දෙසැම්බර් දක්වා කාලය තුළ රුපියල් මිලියන 1.5 සිට රුපියල් මිලියන 7 දක්වා මුදලක් පොලී ආදායමක්ද රහිතව නිෂ්කාර්ය ලෙස රඳවා තිබුණි.

5.2.4 කෘෂි සංවර්ධන අත්තිකාරම් ගිණුම

---

සමාලෝචිත වර්ෂයේ මෙම වාණිජ අත්තිකාරම් ගිණුම සම්බන්ධයෙන් පහත සඳහන් කරුණු නිරීක්ෂණයන් විය.

(අ) 2006 වර්ෂයේ සිට අඛණ්ඩව ගිණුම් වල දක්වා තිබුණු රු.16,295 ක් වූ මාර්ගස්ථ මුදල් ශේෂය හඳුනාගෙන අවශ්‍ය ගැලපීම් සිදුකර නොතිබුණි.

(ආ) 2014 වර්ෂය සඳහා නියමකර තිබුණු රු.700,000 ක් වූ අවම ලැබීම් සීමාව වෙත රු.283,838 කින් ළඟාවී නොතිබුණි.

## 06. මෙහෙයුම් සමාලෝචනය

### 6.1 කාර්යය සාධනය

6.1.1 සමාලෝචිත වර්ෂයේදී පළාත් සභාව වෙත ලැබී තිබුණු සංවර්ධන ප්‍රදාන උපයෝජනය කිරීම සඳහා අනුමත කර තිබුණු, ක්‍රියාත්මක කර තිබුණු සහ නිමකර තිබුණු ව්‍යාපෘති පිළිබඳ විස්තර පහත දැක්වේ.

| | පළාත් සභා සංවර්ධන ප්‍රදාන | | පළාත් නිශ්චිත සංවර්ධන ප්‍රදාන | | ලෝක බැංකු ආධාර | | වෙනත් මූලධන වත්කම් ප්‍රදාන | සාමූහික ප්‍රදාන | |
|---|---|---|---|---|---|---|---|---|---|
| | නව ව්‍යාපෘති | අවිච්ඡේද ව්‍යාපෘති | නව ව්‍යාපෘති | අවිච්ඡේද ව්‍යාපෘති | නව ව්‍යාපෘති | අවිච්ඡේද ව්‍යාපෘති | අවිච්ඡේද ව්‍යාපෘති | නව ව්‍යාපෘති | අවිච්ඡේද ව්‍යාපෘති |
| අනුමත සංවර්ධන ව්‍යාපෘති ගණන | 1062 | 344 | 550, | 302 | 226 | 48 | 01 | 54 | 25 |
| ක්‍රියාත්මක කල ව්‍යාපෘති ගණන | 1059 | 242 | 550 | 266 | 218 | 35 | 01 | 54 | 25 |
| වර්ෂය තුල නිමකල ව්‍යාපෘති ගණන | 855 | 199 | 264 | 257 | 149 | 22 | 01 | 23 | 23 |
| අනුමත වියදම 000‘ | 594,492 | 389,496 | 535,232 | 452,177 | 424,171 | 156,242 | 35,000 | 61,.698 | 13.301 |
| වර්ෂය තුල දැරූ වියදම 000‘ | 471,994 | 203,938 | 290,164 | 427,543 | 240,271 | 91,509 | 17,.920 | 52,793 | 12.,775 |

පහත නිරීක්ෂණයන්ද කරනු ලැබේ.

(අ) පළාත් සභා සංවර්ධන ප්‍රදාන යටතේ අනුමත කර තිබුණු රු.594,492,450 ක් වූ නව සංවර්ධන ව්‍යාපෘති 1062 කින් 1059 ක් ක්‍රියාත්මක කර ඒ සඳහා රු.471,994,662 ක් උපයෝජනය කර තිබුණි. එසේ වුවද වර්ෂය තුල නිමකර තිබුණේ සංවර්ධන ව්‍යාපෘති 855 ක් පමණි. එසේම සමාලෝචිත වර්ෂයට අවිච්ඡේදව පැවති රු389,496,180 ක් වූ සංවර්ධන ව්‍යාපෘති 344 කින් 242 ක් ක්‍රියාත්මක කර ඒ සඳහා රු.203,938,178 ක් උපයෝජනය කර තිබුණු අතර සංවර්ධන ව්‍යාපෘති 199 ක් නිමකර තිබුණි.

(ආ) පළාත් නිශ්චිත සංවර්ධන ප්‍රදාන යටතේ අනුමත කර තිබුණු රු.535,232,725 ක් වූ නව සංවර්ධන ව්‍යාපෘති 550 ම ක්‍රියාත්මක කර ඒ සඳහා රු.290,164,778 ක් උපයෝජනය කර තිබුණි. එසේ වුවද වර්ෂය තුල නිමකර තිබුණේ සංවර්ධන ව්‍යාපෘති 264 ක් පමණි. එසේම සමාලෝචිත වර්ෂයට අවිච්ඡේදව පැවති රු.452,177,540 ක් වූ සංවර්ධන ව්‍යාපෘති 302 කින් 266 ක් ක්‍රියාත්මක කර ඒ සඳහා රු.427,543,764 ක් උපයෝජනය කර තිබුණු අතර ව්‍යාපෘති 257 ක් පමණක් අවසන් කර තිබුණි.

(ඇ) ලෝක බැංකු ආධාර යටතේ අනුමත කර තිබුණු රු.424,171,200 ක් වූ නව සංවර්ධන ව්‍යාපෘති 226 කින් 218 ක් ක්‍රියාත්මක කර ඒ සඳහා රු.240,271,620 ක් උපයෝජනය කර තිබුණි. එසේ වුවද වර්ෂය තුල නිමකර තිබුණේ සංවර්ධන ව්‍යාපෘති 149 ක් පමණි. එසේම සමාලෝචිත වර්ෂයට අවිච්ඡේදව පැවති රු.156,242,120 කට ඇස්තමේන්තු කර තිබුණු 48 ක් වූ සංවර්ධන ව්‍යාපෘති වලින් 35 ක් ක්‍රියාත්මක කර ඒ සඳහා රු.91,509,266 ක් උපයෝජනය කර තිබුණු නමුත් වර්ෂය තුල නිමකර තිබුණේ ව්‍යාපෘති 22 ක් පමණි.

(ඈ) සාමූහික ප්‍රදාන යටතේ අනුමත කර තිබුණු රු.61,698,270 ක් වූ නව සංවර්ධන ව්‍යාපෘති 54 ම ක්‍රියාත්මක කර ඒ සඳහා රු.52,793,314 ක් උපයෝජනය කර තිබුණි. එසේ වුවද වර්ෂය තුල නිමකර තිබුණේ සංවර්ධන ව්‍යාපෘති 23 ක් පමණි. එසේම රු.13,301,176 ක් වූ සමාලෝචිත වර්ෂයට අවිච්ඡේදව පැවති ව්‍යාපෘති 25 ම ක්‍රියාත්මක කර ඒ සඳහා රු.12,775,284 ක් උපයෝජනය කර තිබුණු අතර ව්‍යාපෘති 23 ක් නිමකර තිබුණි.

(ඉ) වෙනත් මූලධන වත්කම් ප්‍රදාන යටතේ අනුමත කර තිබුණු රු.35,000,000 ක් වූ නව සංවර්ධන ව්‍යාපෘතියක් ක්‍රියාත්මක කර වර්ෂය තුල නිමකර තිබුණු නමුත් ගෙවා අවසන් කර තිබුණේ රු.17,920,150 ක් පමණි.

6.1.2 2011 වර්ෂයේ සිට 2014 වර්ෂය දක්වා කාලපරිච්ඡේදයේදී ප්‍රතිසංස්කරණය කර තිබුණු වැව් අතරින් විගණනය විසින් පරීක්ෂාවට භාජනය කරනලද වැව් ප්‍රතිසංස්කරණයන් 06 ක් සඳහා දෙපාර්තමේන්තුව විසින් රු.10,452,210 ක් වැය කර තිබුණු අතර අදාල ශක්‍යතා අධ්‍යයන වාර්තා ඉදිරිපත් නොවුයෙන් සමස්ථ වැය කිරීම්වල ආර්ථික ප්‍රතිලාභය විගණනයේදී අනාවරණය කර ගත නොහැකි විය.

6.2 කළමනාකරණ අකාර්යක්ෂමතා.

------------------------------------

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) පළාත් කර්මාන්ත සංවර්ධන දෙපාර්තමේන්තුව විසින් පේෂකර්ම මධ්‍යස්ථාන 20 ක් පවත්වා ගෙන යන අක්කර 07 යි පර්චස් 85 ක් වූ ඉඩම්වල අයිතිය රජය/අධිකාරිය හෝ වෙනත් බාහිර පුද්ගලයන් සතු වන අතර එම ඉඩම්වල අයිතිය දෙපාර්තමේන්තුව වෙත පවරා ගැනීමට 2015 මැයි 29 වන විටත් කටයුතු කර නොතිබුණි.

(ආ) රණවිරු ස්මාරකය ඉදිකිරීම වෙනුවෙන් 2014 වර්ෂයේ දී ආණ්ඩුකාරවර ලේකම් කාර්යාලය වෙත රණවිරු සේවා අධිකාරියෙන් ලැබී තිබුණු රු.1,095,000 ක් ද රණවිරු උපහාර උළෙල හා රණවිරු ඵලකයේ කටයුතු වෙනුවෙන් පළාත් භාණ්ඩාගාරයෙන් ලැබී තිබුණු රු.600,000 ක් ද ලැබී තිබුණි. එසේ වුවද ආණ්ඩුකාරවරයා ලේකම් කාර්යාලය විසින් රණවිරු උපහාර උළෙල පමණක් පවත්වා රු.1,464,134 ක් පළාත් භාණ්ඩාගාරය වෙත ආපසු යවා තිබුණි.

(ඇ) 2014 වර්ෂයේ පළාත් ආයුර්වේද දෙපාර්තමේන්තුවේ වැය විෂයන් 03 ක් සඳහා සලසා තිබුණු ප්‍රතිපාදනයන් ප්‍රමාණවත් නොවන්නේ යැයි සඳහන් කර, එකතුව රු.21,861,000 ක් වූ පරිපූරක ප්‍රතිපාදන අනුමත කරවාගෙන තිබුණු නමුත්, එයින් සියයට 81 ක් වූ රු.17,641,307 ක් ඉතිරි කර තිබුණි.

(ඈ) උතුරු මැද පළාත් ඉඩම් සංවර්ධන ප්‍රඥප්තිය ක්‍රියාත්මක කිරීම සඳහා පළාත් ඉඩම් කොමසාරිස් දෙපාර්තමේන්තුව විසින් ක්‍රියාත්මක කළ කාර්යයන් පිළිබඳව ප්‍රගති වාර්තා සකස් කර නොතිබුණි.

(ඉ) මහවිලච්චිය ප්‍රාදේශීය රෝහල් ගොඩනැගිල්ල හා නිල නිවාසය සහිත ඉඩමේ අයිතිය නිරවුල් කර ගැනීම හා අනවසර අත්පත් කරගැනීම සම්බන්ධයෙන් ඉකුත් වර්ෂයේදී විගණන විමසුමක් නිකුත් කර ඇතත් අනවසර අත්පත් කරගැනීම වළක්වා ගැනීමට විධිමත් ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි.

(ඊ) පළාත් සභා හා පළාත් සභා ලේකම් කාර්යාලය විසින් මිලට ගෙන ඇති වත්කම් වලින් විශාල ප්‍රමාණයක් පළාත් සභා පනතේ විධිවිධානයන්ට පටහැනිව පත්කර ගෙන ඇති තනතුරුධාරීන් 04 දෙනෙකුට ලබා දී ඇතත් එකී භාණ්ඩ පළාත් සභා ලේකම් කාර්යාලය පරිශ්‍රයේ පිහිටි එකී තනතුරුධාරීන් හතර දෙනාගේ කාර්යාලවල නොතිබුණි. ධූරධාරීන්ගේ සභ සභානායකගේ හා විපක්ෂනායකගේ පෞද්ගලික කාර්යමණ්ඩලය සඳහා සමාලොචිත වර්ෂයේදී රු.5,830,380 ක් වැටුප් හා දීමනා ලෙස ගෙවා තිබුණු නමුත් එකී කාර්යය මණ්ඩලයේ පැමිණීම තහවුරු කිරීමට ප්‍රමාණවත් සාක්ෂි විගණනයට ඉදිරිපත් නොවූ අතර කාර්යාල පරීක්ෂා කිරීමේදී ඔවුන් කාර්යාලය තුල සේවයේ යෙදී නොසිටි බවද තහවුරු විය.

## 6.3 මෙහෙයුම් අකාර්යක්ෂමතා

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) සමාජ සේවා දෙපාර්තමේන්තුව විසින් ආබාධිත පුද්ගලයන්ගේ ඉල්ලීම් පදනම් කර ගෙන අවශ්‍යතාවය මත උපකරණ මිලට ගැනිමට තීරණය නොකර සමාලෝචිත වර්ෂයේදී එකතු වටිනාකම රු.11,951,677 ක් වූ උපකරණ වර්ග 09 ක් මිලට ගෙන තිබුණු අතර 2014 දෙසැම්බර් 31 දිනට වටිනාකම රු.13,994,647 ක් වූ තොගයක් ගබඩාවල ඉතිරි වී තිබුණි.

(ආ ) 2014 වර්ෂයේ දෙසැම්බර් 30 වන දින පාරම්පරික ආයුර්වේද වෛද්‍යවරුන් වෙත ලබාදීම සඳහා ලියා අත්සන් කර තිබුණු රු.1,100,900 ක් වටිනා චෙක්පත් 404 ක් 2015 මාර්තු 31 දින වන විටත් ඔවුන් වෙත ලබා නොදී ආයතනය වෙතම රඳවාගෙන තිබුණු අතර, එම චෙක්පත්වල දින 30 ක් වූ වලංගු කාල සීමාව ද ඉක්ම වී ගොස් තිබුණු නමුත්, ඒ සම්බන්ධයෙන් අවශ්‍ය ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.

(ඇ) විගණන විමසුමක් මගින් අවධානය යොමු කර තිබියදීත් 2012 / 2013 මහ කන්නයේ වී මිලට ගැනිම සඳහා කහටගස්දිගිලිය විවිධ සේවා සමුපකාර සමිතියට ලබා දී තිබුණු රු.1,000,000 ක් වූ අත්තිකාරම් මුදල පියවා ගැනීමට කළමණාකරණය විසින් අවශ්‍ය ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.

(ඈ) 2015 මාර්තු 03 වන දින තඹුත්තේගම දිස්ත්‍රික් රෝහලේ ඖෂධ තොග ලේඛන පරීක්ෂා කිරීමේදී ඖෂධ ඉන්වොයිස් පත්‍රිකා 31 කට අදාල රු.6,338,310 ක් වටිනා ඖෂධ තොග එකී ලේඛන වලට ඇතුලත් කර නොතිබුණු බව නිරීක්ෂණය විය.

(ඉ) 2013 වර්ෂයේ දෙසැම්බර් මස 01 වන දින සිට හොරොව්පොතාන රෝහලේ වෛද්‍ය රසායනාගාර ශිල්පියෙකුගේ පුරප්පාඩුවක් තිබීම හේතුවෙන් මාස 11 ක පමණ කාලයක සිට රසායනාගාරය වසා දමා තිබුණු අතර එම නිසා රසායනාගාර පරීක්ෂණ සිදු කිරීමට යොදා ගන්නා රසායනික ද්‍රව්‍ය අභාවිතව පැවතුණි. එසේම වර්ග 09 කට අයත් රු.493,186 ක් වටිනා රසායනික ද්‍රව්‍ය තොගයක් කල් ඉකුත් වී තිබුණි.

(ඊ) 2008 පෙබරවාරි මාසයේදී තඹුත්තේගම දිස්ත්‍රික් රෝහලේ දින රු.3,894,043 ක් වැය කර ඉදිකිරීම් අවසන් කර තිබුණු හදිසි ප්‍රතිකාර ඒකකයේ කටයුතු සමාලෝචිත වර්ෂයේදීද ආරම්භ කර නොතිබුණි.

(උ) උතුරු මැද පළාත් ප්‍රධාන අමාත්‍යාංශයේ අරමුණු හා කාර්යයන්ට ඇතුළත් නොවන එසේම උතුරු මැද පළාත් සභාවේ වෙනත් අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු ඇතුළු ආයතනවල හා මධ්‍යම රජයේ අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු ඇතුළු ආයතනවල අරමුණු හා කාර්යයන්ට ඇතුළත් ඇතැම් කටයුතු ප්‍රධාන අමාත්‍යාංශය විසින් සිදුකර තිබුණු අතර සමාලෝචිත වර්ෂයේදී සිදුකර තිබුණු එකී කටයුතු වෙනුවෙන් ගෙවා තිබුණු මුදල රු.65,362,633 ක් විය.

(ඌ) රන්බිමට අරුණළු ව්‍යාපෘතිය යටතේ ක්‍රියාත්මක කිරීමට සැලසුම් කරන ලද කාර්යයන් 39 න් 28 ක්ම වෙනත් අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තුවල අරමුණු හා කාර්යන් බව නිරීක්ෂණය විය.

## 6.4 මතභේදයට තුඩුදෙන ගනුදෙනු

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) පළාත් සභා ප්‍රධාන අමාත්‍යවරයාගේ සහ පළාත් සභා අමාත්‍යවරුන්ගේ දීමනා සහ ඔවුන්ගේ පෞද්ගලික කාර්ය මණ්ඩලවල දීමනා සඳහා එක් එක් අමාත්‍යාංශ වැය ශිර්ෂයන් යටතේ සලසා ඇති ප්‍රතිපාදන වලින් එකී සම්පූර්ණ දීමනා ගෙවා තිබුණි. එසේ වුවත් එකී ගෙවීම් වලට අතිරේකව පළාත් සභා හා සභා ලේකම් කාර්යාල වැය ශිර්ෂය යටතේ 2014 වර්ෂයේදී රු.4,877,400 ක රියදුරු දීමනා හා පෞද්ගලික කාර්ය මණ්ඩල දීමනා ගෙවා තිබුණු අතර ඉකුත් වර්ෂ දෙකේදී ගෙවා තිබුණු එකී දීමනා රු.8,056,200 ක් විය.

(ආ) ග්‍රාම සංවර්ධන දෙපාර්තමේන්තුවට අයත් වාහනයක් සඳහා ස්ථිර රියදුරෙකු යොදවා සිටියදී අධ්‍යාපන හා සංස්කෘතික අමාත්‍යවරයාගේ පෞද්ගලික කාර්යය මණ්ඩලයේ අනියම් රියදුරෙකුද එකී වාහනයේ සේවයේ යොදවා සමාලෝචිත වර්ෂයේ ජනවාරි සිට දෙසැම්බර් දක්වා කාලය සඳහා රු.282,693 ක් වැටුප් වශයෙන් ගෙවා තිබුණි.

(ඈ) පළාත් ඉඩම් කොමසාරිස් දෙපාර්තමේන්තුවේ නිලධාරින්ට සහ ප්‍රාදේශිය ලේකම් කාර්යාලවල ඉඩම් රාජකාරිවල නිරත වූ නිලධාරින්ට දිරි දීමනා ලෙස 2014 වර්ෂයේ දී රු.3,415,893 ක් ගෙවා තිබුණු නමුත්, එම නිලධාරින් ඍජුවම බදු ආදායම් රැස් කර ගැනීමට දායක වන බව හෝ අදාල නිලධාරින් ක්ෂේත්‍රයට ගොස් ඉඩම් බදුකරුවන්ගෙන් බදු මුදල් එකතු කළ බව හෝ සනාථ කෙරෙන සාක්ෂි කිසිවක් විගණනයට ඉදිරිපත් නොවුනි. තවද එම දිරි දීමනා ගෙවීම සඳහා දිරි දීමනා යෝජනා ක්‍රමය සඳහා හෝ විධිමත් අනුමැතියක් පළාත් ආණ්ඩුකාරවරයාගෙන් ලබාගෙන නොතිබුණි.

(ඇ) උතුරු මැද පළාත් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ කාර්යාලයේ සේවය කරන ලද වෛද්‍ය නිලධාරින් දෙදෙනෙකුට 2014 වර්ෂයේ දී පෙරවරු 8.30 ට පෙර කාලය සහ දහවල් 12.00 -13.00 ත් අතර කාලය සඳහා රාජකාරි පැය 356 ¼ ක් සඳහා රු.146,716 ක අතිකාල දීමනා ගෙවා තිබුණි.

(ඉ) හොරොව්පොතාන ප්‍රාදේශීය රෝහලේ සේවයේ නියුතු ස්ථානභාර වෛද්‍ය නිලධාරීවරයා ඇතුළුව වෛද්‍ය නිලධාරීන් දෙදෙනෙකු 1999 මාර්තු මස 17 වන දිනැති සෞඛ්‍ය අමාත්‍යාංශයේ පොදු චක්‍රලේඛ අංක 02/99 දරන චක්‍රලේඛයේ 05 ඡේදයට පටහැනිව, රජයේ නිල නිවාස වල පෞද්ගලික වෛද්‍ය සේවයේ යෙදී තිබුණු නමුත්, ඒ සඳහා උක්ත චක්‍රලේඛයේ 11 ඡේදය ප්‍රකාරව, විනයානුකුල ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.

6.5 අවිධිමත් ගනුදෙනු

----------------------

(අ) ප්‍රසම්පාදන මාර්ගෝපදේශ ක්‍රියාපටිපාටියෙන් බැහැරවීම

-----------------------------------------------------------------

පහත නිරික්ෂණයන් කරනු ලැබේ.

i. ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ යොමුව 2.14.1 ප්‍රකාරව, දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුවක රු. මිලියන 2 කට අඩු මිලදී ගැනීම් වලදී මුද්‍රා තැබූ මිල ගණන් පහකට නොඅඩු සංඛ්‍යාවක් කැඳවිය යුතු වුවත්, සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව විසින් 2014 දෙසැම්බර් 31 දින බහු කාර්ය මුද්‍රණ යන්ත්‍ර 31 ක් රු.840,100 කට මිලදී ගැනීමේ දී ආයතන 03 කින් පමණක් මිල ගණන් ලබාගෙන තිබුණි.

ii. ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 2.14.1 ට අතිරේකව 2012 පෙබරවාරි 23 දින නිකුත් කළ 21 අතිරේකය ප්‍රකාරව, දෙපාර්තමේන්තුවක භාණ්ඩ හා සේවා ප්‍රසම්පාදන වටිනාකම රු.මිලියන 2 ට වඩා වැඩි වනවිට එම ප්‍රසම්පාදන අධිකාරිත්වය අමාත්‍යාංශ ප්‍රසම්පාදන කමිටුවකට යොමු කළ යුතු වුවත්, සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුවේ රු.2,784,626 ක් වූ නිදැලි කුකුළු පාලන ව්‍යාපෘතිය සඳහා ප්‍රසම්පාදන ක්‍රියාවලිය දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුව විසින් සිදු කර තිබුණි.

iii. 2011 මාර්තු 09 දිනැති ප්‍රසම්පාදන අත්පොත සඳහා වූ 22 අතිරේකය ප්‍රකාරව ප්‍රජාපාදක සංවිධාන සඳහා සෘජු කොන්ත්‍රාත් ප්‍රදානයේ දී දැනටමත් පිරිනමා ඇති කොන්ත්‍රාත්වල මුළු වටිනාකම හා යෝජිත කොන්ත්‍රාත්තුවේ වටිනාකමෙහි එකතුව රු.මිලියන 02 ක් නොඉක්මවිය යුතුවිය. එයට පටහැනිව අනුරාධපුර ප්‍රාදේශීය සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ කාර්යාලය විසින් රු.2,612,028 ක් වූ කොන්ත්‍රාත් 02 ක් අංක 18 සමෘද්ධි ගම්මාන සමිතියක් වෙත එකම කාල සීමාවක් තුල දී ප්‍රදානය කර තිබුණි.

iv. 2006 ප්‍රසම්පාදන මාර්ගෝපදේශ 2.14.1 සහ ප්‍රසම්පාදන අත්පොත සඳහා වූ 21 අතිරේකය ප්‍රකාරව ප්‍රාදේශීය ප්‍රසම්පාදන කමිටුවකට වෙළඳපොල මිල සැදහුම් ක්‍රමය අනුගමනය කරමින් භාණ්ඩ හා සේවා ප්‍රසම්පාදනය කළ හැකි සීමාව රු.500,000 ක් වුවත්, එයට පටහැනිව අනුරාධපුර ප්‍රාදේශීය සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ කාර්යාලයේ ප්‍රාදේශීය ප්‍රසම්පාදන කමිටුව විසින් එකී සීමාව ඉක්මවා අවස්ථා 03 ක දී රු.2,612,409 ක මිලට ගැනීම් සිදු කර තිබුණි.

6.6 දෘෂ්‍ය අක්‍රමිකතා

--------------------

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) 2007 නොවැම්බර් 19 දිනැති අංක සීඑස්ඒ/පී1/40 දරන චක්‍රලේඛ ලිපියෙන් සංශෝධිත 2006 ජනවාරි 04 දිනැති සමාංක දරන අතිගරු ජනාධිපතිතුමාගේ චක්‍රලේඛ ලිපියේ 2.1 ඡේදය ප්‍රකාරව ගරු ප්‍රධාන අමාත්‍යවරයාගේ පරිහරණය හා ආරක්ෂක කටයුතු වෙනුවෙන් වෙන්කල හැකි උපරිම නිල වාහන සංඛ්‍යාව 03 ක් වුවද උතුරුමැද පළාත් ගරු

ප්‍රධාන අමාත්‍යවරයා එකී අනුමත සීමාව ඉක්මවා වාහන 15 ක් භාවිතා කර තිබුණු අතර එකී වාහන ධාවනය සඳහා රු.5,989,771 ක් වූ ඉන්ධන ලීටර් 44,850 ක් ලබාගෙන තිබුණි.

(ආ) ගරු ප්‍රධාන අමාත්‍යවරයාට වෙන්කර දෙන ලද නිල රථ දෙක හා ආරක්ෂක රථය ඩීසල් රථ බැවින් 2007 නොවැම්බර් 19 දිනැති අතිගරු ජනාධිපතිතුමාගේ චක්‍රලේඛ ලිපිය ප්‍රකාරව නිල ඩීසල් රථ දෙකට හා ආරක්ෂක රථයට හිමි ඉන්ධන සීමාව ඉක්මවා වර්ෂය තුල ඉන්ධන ලීටර් 13250 ක් ලබාගෙන තිබුණු අතර ඒ සඳහා රු.1,800,983 ක් ගෙවා තිබුණි.

(ඇ) 2006 ජනවාරි 04 දිනැති අංක සීඑස්ඒ/පී1/40 දරන අතිගරු ජනාධිපතිතුමාගේ චක්‍රලේඛ ලිපියේ 1.1 ඡේදය ප්‍රකාරව අමාත්‍යවරයෙකුට හිමි පෞද්ගලික කාර්ය මණ්ඩලය ඉක්මවූ කාර්ය මණ්ඩලයක් පවත්වාගැනීම හේතුවෙන් සමාලෝචිත වර්ෂය තුල අතිරික්ත පෞද්ගලික කාර්ය මණ්ඩලය වෙනුවෙන් දරන ලද වැටුප්, අතිකාල හා ගමන් වියදම් පිරිවැය රු.9,634,113 ක් විය.

(ඈ) වාහනවලට ඉන්ධන ඇණවුම් නිකුත් කිරීමට පෙර වාහන භාර නිලධාරීන්ගෙන් ලබා ගන්නා ඉන්ධන ඉල්ලුම් පත්‍රවල ප්‍රධාන අමාත්‍යාංශයේ ලේකම්වරයා හෝ ඔහු විසින් බලය පැවරූ රජයේ නිලධාරියෙකු විසින් ඇණවුම් නිකුත් කිරීමට බලය දිය යුතු වුවත් අමාත්‍යාංශ ලේකම්වරයාගේ නිල මුද්‍රාව යොදා ප්‍රධාන අමාත්‍යවරයා හෝ ඔහුගේ පෞද්ගලික කාර්යය මණ්ඩලයේ නිලධාරියෙකු ඉන්ධන ඇණවුම් නිකුත්කිරීමට බලය දී ඔවුන් වෙත වෙන්කර දී තිබුණු වාහනවලට ඉන්ධන ලබාගෙන තිබුණි.

6.7 වත්කම් කළමනාකරණය.

-----------------------------

ආයතන සංග්‍රහයේ XIX වැනි පරිච්ඡේදයේ 6.10 වගන්තිය හා 1971 අංක 03 හා 1974 අංක 40 දරන පනත් වලින් සංශෝධිත 1969 අංක 07 දරන රජයේ නිවාස (සන්තකය ආපසු ලබාගැනීමේ) පනත ප්‍රකාරව නිලධාරියෙකු මිය ගිය විට රජයේ නිවාස ආපසු භාරදිය යුතු වුවද, එම නියමයන්ට එරෙහිව මියගිය නිලධාරියෙකුගේ පවුලේ සාමාජිකයින් 2004 අප්‍රේල් 29 දින සිට වසර 11 ක් කිසිදු කුලී ගෙවීමකින් තොරව රජයේ නිවාසයක පදිංචි වී සිටි නමුත්, විගණන දින දක්වාම අදාළ නිවස ආපසු ලබාගෙන නොතිබුණු අතර බදු කාලය අවසන් වී තිබුණු නිල නිවාස වල පදිංචි නිලධාරීන් 04 දෙනෙකුට එරෙහිව ආයතන සංග්‍රහයේ XIX වැනි පරිච්ඡේදයේ 6.14 වැනි

උපවගන්තිය හා 1969 අංක 07 දරන රජයේ නිවාස (සන්තකය ආපසු ලබාගැනීමේ) පනත ප්‍රකාරව විධිමත් පරිදි කටයුතු නොකිරීම නිසා එකී පදිංචිකරුවන් විසින් රජයේ දේපල අත්පත් කර ගැනීඹ සඳහා අධිකරණ ක්‍රියාමාර්ග ගනිමින් බලහත්කාරයෙන් රජයේ නිවාසවල පදිංචි වී සිටින බව නිරීක්ෂණය විය.

6.8 නිෂ්ක්‍රිය හා ඌණ උපයෝජිත වත්කම්

-----------------------------------------

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ ) ග්‍රාම සංවර්ධන දෙපාර්තමේන්තුව විසින් 2013 වර්ෂයේ මිලට ගෙන තිබුණු රු.318,878 ක් වටිනා ස්වයං රැකියා උපකරණ වර්ග 04 ක් 2015 ජනවාරි 14 වන විටත් බෙදා හැරීමකින් තොරව ගබඩාවේ රඳවා තිබුණි.

(ආ) බක්මීගහඋල්පත වැවෙහි සොරොව්වෙන් පිටවන ජලය කුඹුරුවලට ගෙන යාම සඳහා ප්‍රදාන වේල්ලක් සහ ඇලවේලි සකස් කිරීම සහ වැව යටතේ ඇති කුඹුරු හඳුනා ගෙන අස්වැද්දීමක් කර නොතිබුණු බැවින් එම වැව් ප්‍රතිසංස්කරණය සඳහා වැයකර තිබුණු රු.2,610,560 ක මුදල නිශ්කාර්ය වී තිබුණි.

(ඇ) පළාත් ඉංජිනේරු දෙපාර්තමේන්තුව සතු වාහන 03 ක් අවුරුදු 02 ත් 10 ත් අතර කාලයක සිට නිෂ්ක්‍රියව පැවතුණි.

(ඈ) 2012 වර්ෂයේ මිලට ගෙන තිබුණු රු.264,510 ක් වටිනා Binocular Microscope 01 ක් හා EC Meter 01 ක් මිලට ගත් දින සිට විගණිත දිනය වන විටත් කිසිදු ප්‍රයෝජනයක් නොගෙන සේවා සංස්කරණ අභ්‍යාස ආයතනයේ නිශ්කාර්යව පැවතුණි.

6.9 ආර්ථික නොවූ ගනුදෙනු

-----------------------------

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) ගරු මැති ඇමතිවරු හා ආණ්ඩුකාරවරයා වෙනුවෙන් වාර්ෂිකව රු.1,387,391 ක ජීවිත රක්ෂණ වාරික ගෙවා තිබුණු අතර එකී ගෙවීම් සනාථ කිරීමට ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාවෙන් ලද ලදුපත් හෝ වෙනත් ලියවිලි විගණනයට ඉදිරිපත් නොකෙරුණි.

(ආ) අනුමත කාර්ය මණ්ඩලය ඉක්මවා නිලධාරීන් 20 කු අමාත්‍යවරයාගේ පෞද්ගලික කාර්යය මණ්ඩලයේ සේවයේ යොදවා තිබියදීත් සමාලෝචිත වර්ෂය තුල රු.9,804,032 ක අතිකාල හා නිවාඩු දින වැටුප් පෞද්ගලික කාර්යය මණ්ඩලයට ගෙවා තිබුණි. ඒ අනුව අනුමත එක් තනතුරක මාසික අතිකාල හා නිවාඩු දින පිරිවැය රු.54,467, ක් වන අතර අවශ්‍යතාවය හඳුනා නොගනිමින් අතිකාල හා නිවාඩු දින වැඩ කිරීමට අවස්ථාව ලබා දී ඇති බව නිරීක්ෂණය විය.

(ඇ) පළාත් ඉඩම් කොමසාරිස් දෙපාර්තමේන්තුවේ මිනින්දෝරුවරයෙකුට 2008 වර්ෂයේ සිට 2014 වර්ෂය දක්වා වැටුප් සහ දීමනා ලෙස රු.3,709,708 ක් ගෙවා තිබුණු නමුත්, ඔහු දිනපතා සේවයට වාර්තා කළ බව හෝ කළ වැඩ සටහන් ඉදිරිපත් කළ බවට හෝ අනුමත ඉදිරි වැසටහන් හෝ ඔහු වෙත මැනුම් නියෝග නිකුත් කළ බවට හෝ සාක්ෂි විගණනයට ඉදිරිපත් නොකෙරුණි.

6.10 කොන්ත්‍රාත් පරිපාලනයේ අඩුපාඩු

---

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) නාච්චාදුව ආයුර්වේද මධ්‍යම බෙහෙත් ශාලාව ඉදිකිරීමේ රු.5,619,719 ක් වූ කොන්ත්‍රාත්තුවේ ගිවිසුම් කාලසීමාව 2012 සැප්තැම්බර් 10 දින සිට 2013 පෙබරවාරි 24 දින දක්වා වූ නමුත්, පිළිගත හැකි හේතු ඉදිරිපත් නොකර එම කාලසීමාව අවස්ථා 02 ක දී 2013 මැයි 24 දින දක්වා මාස 03 කින් දීර්ඝ කර තිබුණි.

(ආ) එක් එක් කොන්ත්‍රාත්තුවේ ඇස්තමේන්තුගත වටිනාකම රු. මිලියන 2.5 ඉක්මවූ ගාලදිවුල්වැව, ගල්අමුණ, නාච්චාදුව ආයුර්වේද රෝහල් සහ තෙල්හිරියාව ආයුර්වේද ඖෂධ නිෂ්පාදනාගාරය අලුත්වැඩියා කිරිම සඳහා වූ කොන්ත්‍රාත්තු 04 ක් විවෘත ටෙන්ඩර් පටිපාටිය අනුගමනය නොකර, සීමිත මිල ගණන් ලබාගෙන පිරි නමා තිබුණි.

(ඇ) පළාත් ඉඩම් කොමසාරිස් දෙපාර්තමේන්තුව විසින් ක්‍රියාත්මක කළ මොරගොඩ තුලානේ රාජ්‍ය සේවකයින් සඳහා වන නිවාස යෝජනා ක්‍රමය සඳහා ප්‍රවේශ මාර්ග සකස් කිරීමේ ව්‍යාපෘතිය සඳහා බොරළු මීටර් කියුබ් 450 ක් සපයා තැලීම් කර සකස් කිරීමට ඇස්තමේන්තු සකස් කර තිබුණු අතර අදාල පස් තැලීම් වාර්තා ඉදිරිපත් කර නොතිබීම නිසා ගෙවිය යුතු මුළු මුදලෙන් සියයට 30 ක් වූ රු.205,800 ක් පමණක් ගෙවිය යුතු බවට තාක්ෂණ නිලධාරිගේ ගෙවීම් නිර්දේශ වාර්තාවේ සඳහන් කර තිබුණු නමුත්, රු.686,000 ක් වූ මුළු මුදලම තලාව ප්‍රාදේශීය සභාව වෙත ගෙවා තිබුණි.

(ඈ) අනුරාධපුර ප්‍රාදේශීය සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ කාර්යාලය විසින් රු.99,602,472 ක් වැයකර ඉදිකර තිබුණු සුනඛ මිතුරු නිවහන 2013 මැයි 03 දින විවෘතකර තිබුණු නමුත් එය 2014 මැයි මාසයේ සිට වසා දමා තිබුණි. එසේම සුනඛ මිතුරු නිවහන ඉදිකිරීමේ කොන්ත්‍රාත්තුවේ වැඩ නිම කිරීම සඳහා ගිවිසුම්ගත කාලසීමාව දින 84 ක් වූ නමුත් ඒ සඳහා තවත් දින 365 ක කල් දිගු ලබා දී තිබුණි.

(ඉ) ප්‍රමාණවත් මූල්‍ය ශක්‍යතාවයන් සහ උපකරණ පහසුකම් තිබෙන බවට සනාථ කරගෙන නොතිබුණු ප්‍රජාපාදක සමිති 07 ක් වෙත අනුරාධපුර ප්‍රාදේශීය සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ කාර්යාලය විසින් රු.10,160,761 ක් වූ කොන්ත්‍රාත් 07 ක් ප්‍රදානය කර තිබුණි.

## 6.11 කාර්ය මණ්ඩල පරිපාලනය

### 6.11.1 අනුමත හා තථ්‍ය සේවක සංඛ්‍යාව

දෙසැම්බර් 31 දිනට උතුරු මැද පළාත් සභාවේ අනුමත හා තථ්‍ය සේවක සංඛ්‍යාව පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

(අ) පළාත් සභා අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු ආයතන

| | | අනුමත | තථ්‍ය | අතිරික්ත | (ඌණතාවය) |
|---|---|---|---|---|---|
| (i) | ජ්‍යෙෂ්ඨ | 633 | 261 | - | (372) |
| (ii) | තෘතීයික | 249 | 177 | - | (72) |
| (iii) | ද්විතීයික | 3702 | 2038 | - | (1663) |
| (iv) | ප්‍රාථමික | 1742 | 1315 | - | (427) |
| (v) | වෙනත් (අනියම්/තාවකාලික) | 13 | 683 | 670 | - |
| | | 6339 | 4474 | 670 | (2534) |

(ආ) කර්මාන්ත සංවර්ධන දෙපාර්තමේන්තුව සඳහා 2014දෙසැම්බර් 31 දිනට අනුමත කාර්ය මණ්ඩලය 157 ක් වූ නමුත් 116 ක් පමණක් සේවයේ නියුක්ත වී සිටි බැවින් පුරප්පාඩු 43 ක් හා අතිරික්තව 02 පැවතුණි.

(ඇ) උතුරු මැද පළාත් සභාව විසින් අභ්‍යන්තර විගණන හා විමර්ශන කටයුතු කිරීම සඳහා පළාත් අභ්‍යන්තර විගණන හා විමර්ශන දෙපාර්තමේන්තුව ස්ථාපිත කර තිබියදී ප්‍රධාන අමාත්‍යාංශය යටතේ විමර්ශන නිලධාරියෙකු පත්කර සමාලෝචිත වර්ෂයේදී රු.883,058 ක් වැටුප් වශයෙන් ගෙවා තිබුණි.

6.11.2 පාසැල් කාර්යය මණ්ඩලය

| | | අනුමත | තථ්‍ය | අතිරික්ත | පුරප්පාඩු සංඛ්‍යාව |
|---|---|---|---|---|---|
| (i) | විදුහල්පති | 1000 | 754 | - | 246 |
| (ii) | ගුරුභවතුන් | 15940 | 14688 | - | 1252 |
| (iii) | ගුරු සහායක | - | 389 | 389 | - |
| (iv) | සැලසුම් හා මූල්‍ය සහකාර/ සංවර්ධන සහකාර/ වැඩසටහන් සහකාර | 796 | 96 | - | 700 |
| (v) | රසායනාගාර සහායක/ නේවාසිකාගාර පාලක | 60 | 17 | - | 43 |
| (vi) | පාසල් කාර්ය සහායක | 417 | 62 | - | 355 |
| (vii) | මුරකරු | 339 | 33 | | 306 |
| | | 18552 | 16039 | 389 | 2902 |

6.14.3 රෝහල් කාර්යය මණ්ඩලය

| | | අනුමත | තථ්‍ය | අතිරික්තය | ඌණතාවය |
|---|---|---|---|---|---|
| (i) | විශේෂඥ වෛද්‍ය නිලධාරී | 21 | 09 | | 12 |
| (ii) | ශ්‍රේණි වෛද්‍ය නිලධාරී | 356 | 278 | | 78 |
| (iii) | අනෙකුත් වෛද්‍ය නිලධාරී | 85 | 90 | 5 | - |
| (iv) | හෙද නිලධාරී (රෝහල්) | 590 | 464 | | 126 |
| (v) | හෙද නිලධාරී (මහජන සෞඛ්‍ය) | 31 | 19 | | 12 |

| | | | | | |
|---|---|---|---|---|---|
| (vi) | මධ්‍යම මට්ටමේ තාක්ෂණික නිලධාරීන් | 182 | 222 | 40 | - |
| (vii) | කම්කරු (සාමාන්‍ය) | 329 | 225 | | 104 |
| (viii) | කම්කරු (සනීපාරක්ෂක) | 350 | 234 | | 116 |
| (ix) | උපස්ථායක | 435 | 334 | | 101 |
| | | 2379 | 1875 | 45 | 549 |

## 07. ගිණුම් කටයුතුභාවය සහ යහපාලනය

### 7.1 ක්‍රියාකාරී සැලැස්ම

රාජ්‍ය මුදල් අධ්‍යක්ෂ ජනරාල්ගේ අංක පීඑෆ්/ආර්/2/2/3/5/(4) හා 2010 මාර්තු 10 දිනැති චක්‍රලේඛ ලිපිය ප්‍රකාරව පළාත් සභාව සහ එහි එක් එක් අමාත්‍යාංශය, දෙපාර්තමේන්තුව සහ ආයතනය විසින් සමාලෝචිත වර්ෂය වෙනුවෙන් ක්‍රියාකාරී සැලසුම් පිළියෙල කර නොතිබුණි.

### 7.2 අභ්‍යන්තර විගණනය

පළාත් සභාවේ අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු හා අනෙකුත් ආයතනවල වැරදි හා වංචා වැලැක්වීම සඳහාත්, වත්කම්වල ආරක්ෂාව තහවුරු කිරීම සඳහාත්, හඳුන්වා දී ඇති පද්ධති හා පාලන ක්‍රමවල දුර්වලතාවයන් හඳුනාගෙන එකී දුර්වලතාවයන් සහ ඒවා මඟහරවා ගැනීමට ගතයුතු ක්‍රියාමාර්ග කළමනාකරණයට වාර්තා කිරිම පළාත් අභ්‍යන්තර විගණන හා විමර්ශන දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යයන් විය. එක් එක් වර්ෂවල විගණන හා විමර්ශන කාර්යය භාරයන් පැවරීමේදී පළාත් සභාවේ අමාත්‍යාංශ 05 ක්, දෙපාර්තමේන්තු 16 ක්, අමාත්‍යාංශ යටතට නොගැනෙන ආයතන 09 ක් සහ අධිකාරී 05 ක් ඇතුළු සියළුම ආයතනවල අභ්‍යන්තර පාලනයන්හි ප්‍රධාන අඩුපාඩු හඳුනාගත හැකිවන ලෙස එය සිදුකල යුතු වුවත් පළාත් අභ්‍යන්තර විගණන හා විමර්ශන දෙපාර්තමේන්තුවේ 2014 වර්ෂයේ විගණන සැලැස්ම අනුව දෙපාර්තමේන්තුව සතුව තිබුණු 730 ක් වූ සම්පූර්ණ මිනිස් දින ප්‍රමාණයම අමාත්‍යාංශ 02 ක් විගණනය කිරීමට පමණක් වෙන්කර තිබුණි.

7.3 විගණන හා කළමනාකරණ කමිටු

2009 ජූනි 09 දිනැති අංක ඩීඑම්ජ්/2009(1) දරන කළමනාකරණ විගණන චක්‍රලේඛයේ 6 ඡේදය ප්‍රකාරව විගණන හා කළමනාකරණ කමිටු යටත් පිරිසෙයින් කාර්තුවකට එක් වරක් හෝ පැවැත්විය යුතු වුවද, සමාලෝචිත වර්ෂයේදී පළාත් සභාවේ එක් එක් අමාත්‍යාංශ/ දෙපාර්තමේන්තු විසින් එකී කමිටු රැස්කර නොතිබුණි.

7.4 ප්‍රසම්පාදන සැලැස්ම

2006 මාර්තු 24 දිනැති අංක 128 දරන ජාතික අයවැය චක්‍රලේඛය ප්‍රකාරව පළාත් සභාවේ අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු හා අනෙකුත් ආයතන විසින් 2014 වර්ෂය වෙනුවෙන් ප්‍රසම්පාදන සැලැස්මක් පිළියෙල කර නොතිබුණි.

08. පද්ධති හා පාලන

පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍ර කෙරෙහි විශේෂ අවධානය යොමු කෙරේ.

(අ) ගිණුම්කරණය

(ආ) ආදායම් පරිපාලනය

(ඇ) කොන්ත්‍රාත් පරිපාලනය

(ඈ) ස්ථාවර වත්කම්

(ඉ) අරමුදල් උපයෝජනය

(ඊ) මානව සම්පත් කළමනාකරණය

(උ) ව්‍යාපෘති සැලසුම් කිරීම හා ක්‍රියාත්මක කිරීම

(ඌ) ප්‍රසම්පාදන ක්‍රියාවලිය

(එ) ගබඩා පාලනය

(ඒ) පැමිණීම හා අතිකාල පාලනය